"ආපදා ප්‍රතිචාර වැඩසටහන්වල නියුතු රතු කුරුස රතු
චන්ද්‍රවංක සමාජ ජාත්‍යන්තර සම්මේලනය (IFRC)/ජාත්‍යන්තර
රතු කුරුස කමිටුව (ICRC) සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා
වන කල්ක්‍රියා මූලධර්ම" උදෙසා කෙරෙන

# විවරණයක්

(IFRC/ICRC කල්ක්‍රියා සංග්‍රහය)

**2005 ජූනි**

**පෙරවදන**

2004 දෙසැම්බර් මස ශ්‍රී ලංකාවේ ඇති වූ සුනාමි ඛේදවාචකය නිසා පැතිරී ගිය විනාශය හේතු කොට ගෙන 31,000කගේ ජීවිත නැති විය, 100,000කට අධික නිවාස සංඛ්‍යාවක් විනාශ වීම නිසා දහස් ගණනක් දෙනා අවතැන් වූහ. ඔවුන්ගේ පවුල් හා ජීවනෝපාය බිඳ දැමිණ, සැලකිය යුතු ප්‍රමාණයක විනාශයක් මුහුදුබඩ යටිතල පහසුකම්වලට සිදු විය, ස්වාභාවික පරිසර පද්ධති විනාශ විය. එහි සමස්ත බලපෑම දශක දෙකක යුද්ධය හේතු කොට ගෙන මිනිසා විසින් ඇති කෙරුණු විනාශය සමග නිරන්තරව සසඳා බැලුණි.

එනමුදු සුනාමි විපතින් මතු වී පෙනුණු එක් දෙයක් වෙයි: එනම් ශ්‍රී ලාංකික සමාජය තුළ වන විපතක දී එකා මෙන් නැගී සිට එකිනෙකාට උපකාර කිරීමේ ජන්ම ගතිය හා ගුණාංගය යි. මේ නිසා ම ජාත්‍යන්තර ප්‍රජාවගේ සහාය ද සමූහත්වය ද නොමඳව අප රටට ලැබිණ. ජනතාව ස්වේච්ඡාවෙන් ම විපතට පත් වූවන්ට සහනාධාර සැපයීමටත් විපතට පත් වූවන්ගේ ජීවිත බේරා ගැනීමටත් ඉදිරිපත් විය: තනි පුද්ගලයන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින්, පෞද්ගලික සමාගම්, රාජ්‍යයන් හා ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික නියෝජ්‍යායතනවලින් විස්මිත ප්‍රමාණයක ආධාර ගලා එන්නට විය. මේ අතරතුර, සහන සහ යළි ගොඩ නැගීම් කටයුතුවල නිරත බොහෝ සංවිධාන සුනාමියෙන් පසුව අප රට තුළ බිහි විය.

මුලාරම්භයේ සිට ම මෙම වැඩවලට දායක වෙමින් ආධාර දුන් දේශීය හා ජාත්‍යන්තර නියෝජ්‍යායතන අවධාරණය කළේ සහනාධාර හා ප්‍රකෘතිකරණ ප්‍රයත්නයන් ඵලදායී වීම උදෙසා ඇතැම් තීරණාත්මක පැතිකඩ, එනම් ගැටුම් සංවේදී හා ඒ අනුව පූර්ව ව්‍යසනවල දී ලත් ජාත්‍යන්තර අත්දැකීම් හඳුනා ගැනීමේ අවශ්‍යතාව යි. මෙය මෙම කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සහ ඒවා ආමන්ත්‍රණය කළ යුත්තේ කෙසේ ද යන්න ගැන වන මාර්ගෝපදේශන මූලධර්ම පිළිබඳව පොදු අවබෝධයක් ඇති කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් මාලාවකට මානුෂීය සේවායතන සමූහය (CHA) හා බර්ගොෆ් පදනම සම්බන්ධ වීමේ ලා ආරම්භක ලක්ෂ්‍යය ද විය.

මෙයින් එක් ක්‍රියාකාරකමක් "ආපදා ප්‍රතිචාර වැඩසටහන්වල නියුතු රතු කුරුස රතු චන්ද්‍රවංක සමාජ ජාත්‍යන්තර සම්මේලනය (IFRC)/ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන කල්ක්‍රියා මූලධර්ම" මත පදනම් විය. මෙම සංග්‍රහය පශ්චාත්-සුනාමි ප්‍රකෘතිකරණය හා සම්බන්ධ වූ CHA වැඩසටහනක දී තහවුරු කෙරුණි. ගැටුම් සංවේදිතාව හා අනෙකුත් මාර්ගෝපදේශන මූලධර්ම පිළිබඳ පශ්චාත්-සුනාමි කතිකාව තුළින්, ආධාර ක්‍රියාකාරකම්වල නියුතු සියලු මහජනතාවට හා සංවිධානවලට තම කටයුතුවල දී ජාත්‍යන්තර මානව සුභසාධන ප්‍රමිතීන් තහවුරු කිරීමට සහාය වීම සඳහා කල්ක්‍රියා සංග්‍රහයේ මූලධර්ම 10

පිළිබඳව ගැඹුරට විහිදුණු විවරණයක් තිබීම සප්‍රයෝජනවත් ය යන නිගමනයට අපි පැමිණියෙමු. මුල් පිටපතක් කෙටුම්පත් කරන ලෙස අප CHA කණ්ඩායමකින් ද බර්ගොෆ් පදනමෙන් ද GTZ (Deutsche Gesellschaft fuer Teschnische zusammenarbeit) ආයතනයෙන් හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙන් (UNDP) ද ඉල්ලා සිටි අතර, අනතුරුව බොහෝ පුද්ගලයන් හා සංවිධානවල උපදෙස් විමසීමේ ක්‍රියාවලියක් තුළින් ලද ප්‍රතිපෝෂණ මත එය ප්‍රතිශෝධනය කරන ලදි.

මෙම ක්‍රියාවලියේ දී අපට සහයෝගිතාවන් දැක්වූ සියලු දෙනාට ම ස්තුතිය පුද කිරීමට අපි කැමැත්තෙමු. විශේෂයෙන් අනුජ්කා අබේනායක විවරණවල ප්‍රධාන කර්තෘත්වය දැරූ අතර ඩේවිඩ් වේලි, දිනූෂා පතිරාජ, මීන්නා තාහීර්, ආචාර්ය මාකස් මේයර් සහ ජෝ විලියම් යන අය ඔවුන්ගේ දායකත්වය හා විවේචනාත්මක ප්‍රතිපෝෂණයන් ලබා දුන්හ.

**ජීවන් ත්‍යාගරාජා, මානුෂීය සේවායතන සමූහය**
**ආචාර්ය නෝබට් රෝපස්, ගැටුම් අධ්‍යයනය සඳහා වූ බර්ගොෆ් පදනම, ශ්‍රී ලංකා කාර්යාලය**

**හැඳින්වීම**

**2004** දෙසැම්බර් **26** දින වෙරළබඩ ජනතාව විපතට පත් කළ සුනාමිය තනි පුද්ගලයන් හා ප්‍රජාවන් තුළ ද රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය හා ලෝකය පුරා ආණ්ඩු තුළ ද පෙර නොවූ විරූ තරමින් උතුරා ගිය සානුකම්පික භාවයක් හා ආධාර ලබා දීමට ඉදිරිපත් වීමක් ජනනය කළේ ය. සුනාමි ව්‍යසනය කෙරෙහි වන ජාත්‍යන්තර ප්‍රතිචාරය ශ්‍රී ලංකාව තුළ සාමය හා සංවර්ධනය උදා කර ගැනීමට හැකි වන නව අවස්ථාවන් උදා කරයි. එමෙන් ම මෙම විපත පිළිබඳව සැලකිල්ලක් දක්වන සියල්ලන්, එනම් ඛේදවාචකයට මුහුණ දුන් රටවල සේ ම ජාත්‍යන්තර ප්‍රජාවේ ද ආණ්ඩු හා සිවිල් සමාජයේ කොටස්කරුවන් විසින් වටහා ගත යුතු බැරෑරුම් අභියෝගයන් ද සුනාමියෙන් ඉස්මතු කෙරුණි. මෙම විපත දේශපාලනික, සමාජ-ආර්ථික හා අත්‍යවශ්‍ය මානව සුභසාධන ප්‍රතිචාරවල දිගු කාලීන ප්‍රතිඵල පිළිබඳව වූ බොහෝ ප්‍රශ්න පැන නංවා ඇත.

**2005** ජනවාරි මස මැද දී මානුෂීය සේවායතන සමූහය (CHA) හා ආධාර දෙන්නන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම (DWG) සමග සහයෝගිතාවෙන් යුතුව බර්ගොෆ් පදනම සුනාමි ප්‍රතිචාර තුළ වන ගැටුම් සංවේදිතාව සම්බන්ධ ගැටලු පිළිබඳව කුඩා විශේෂඥ-රැස්වීමක් පැවැත්වී ය.

සහභාගිකයන් අතරට පහත දැක්වෙන ආයතන හා සංවිධාන ඇතුළත් විය: සර්වෝදය, මාර්ග, මුස්ලිම් කාන්තා පර්යේෂණ හා ක්‍රියාකාරී සංසදය (MWRAF), දරිද්‍රතා හා සාමාජීය ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ හැකියාධාරිතා වර්ධනය (ඉම්කැප් – IMCAP), සාමූහික පැවැත්ම සඳහා වූ පදනම (FCE), විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය (CPA), මානුෂීය සේවායතන සමූහය (CHA), දෙමළ පුනරුත්ථාපන සංවිධානය (TRO), සමාජ විද්‍යාඥයන්ගේ සංගමය (SSA), දකුණු ආසියාතික දර්ශක ජාල සංගමය (සප්නා – SAPNA), ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍යායතනය (යුසේඩ් – USAID), ආසියානු සංවර්ධන බැංකුව (ADB), ලෝක බැංකුව (WB), ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනය (සීඩා-ස්වීඩන – SIDA), නෙදර්ලන්ත තානාපති කාර්යාලය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුව (DFID), ගැටුම් පරිවර්තනය පිළිබඳ දේශීය මුල පිරිම් උදෙසා වූ අරමුදල (ෆ්ලික්ට් – FLICT), GTZ (Deutsche Gesellschaft fuer Teschnische zusammenarbeit), ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය, බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය, සංවර්ධන සහයෝගිතාව පිළිබඳ නෝර්වේ නියෝජ්‍යායතනය (නෝරාඩ් – NORAD), කැනඩානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනය (සීඩා-කැනඩානු – CIDA), විදේශ ස්වේච්ඡා සේවය (VSO), එක්සත්

ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ් – UNICEF), ගැටුම් අධ්‍යයනය සඳහා වූ බර්ගොෆ් පදනම.

"පශ්චාත්-සුනාමිය තුළ ගැටුම් සංවේදිතාව" පිළිබඳව කොළඹ පැවැත්වූ මෙම රැස්වීම්වල (2005 ජනවාරි-පෙබරවාරි) දී, මානව සුභසාධන ප්‍රයත්නයන් සඳහා වූ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් වෙත වන ප්‍රයෝජනවත් පිවිසුම් ලක්ෂ්‍යයක් ලෙස "ආපදා ප්‍රතිචාර වැඩසටහන්වල නියුතු රතු කුරුස රතු චන්ද්‍රවංක සමාජ ජාත්‍යන්තර සම්මේලනය (IFRC)/ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන කල්ක්‍රියා මූලධර්ම" උදෙසා කෙරෙන විවරණ හඳුනා ගන්නා ලදි.

**උපදෙස් විමසීමේ ක්‍රියාවලියක්**

CHA කණ්ඩායමක්, බර්ගොෆ් පදනම, GTZ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින්, විවරණය කළ කල්ක්‍රියා සංග්‍රහයක පළමු පිටපතක් ඉදිරිපත් කරන ලදි. පශ්චාත් සුනාමි සහනාධාර, පුනරුත්ථාපන හා සංවර්ධන කටයුතුවල යෙදී සිටින නියෝජ්‍යායතන තමන්ගේ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී හා කළමනාකරණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු ශ්‍රී ලාංකික සන්දර්භයේ වැදගත් පැතිකඩ පිළිබඳව දැනුවත් කිරීම සහතික කිරීමට දායක වීමක් ලෙස මෙම පිටපත වර්ධනය කෙරුණි. IFRC/ICRC මූලධර්ම තුන් ආකාරයකට විභාග කරන ලදි.

- සමස්ත ශ්‍රී ලාංකික සන්දර්භයට ඒවා කෙතරම් උචිත ද යන වගඃ ගැටලු සහ ප්‍රවණතාවන් හඳුනා ගැනීම
- සුනාමි ව්‍යසනය හා සම්බන්ධිතව පැන නගින උත්සුකතා
- සාමය හෝ කලබලකාරී තත්ත්වයන් යළි පණ ගැන්වීම කෙරෙහි දායක වීමට මානව සුභසාධන ආධාරවල ඇති විභව්‍යතාව

2005 පෙබරවාරි 9 වන දින, "සාමයට මුල පිරීම කෙරෙහි පශ්චාත්-සුනාමි ක්‍රියාකාරකම්වල ඇඟවුම්" යන මැයෙන් CHA කාර්යාලයේ දී පවත්වනු ලැබූ වැඩමුළුවක දී මෙම පිටපත රාජ්‍ය නොවන සංවිධානවල හා ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ආධාර දෙන සංවිධානවල සහභාගිකයන් අතර බෙදා දෙන ලදි. එමෙන් ම පිටපතට කෙරෙන එකතු කිරීම් දිරි ගන්වන ලදි.

ඊමේල් පණිවුඩ මගින් ලැබුණු යෝජනා ස්වල්පයෙන් යෝජනා කර තිබුණේ තම වගකීම් මොනවා ද යන්න කෙරෙහි රාජ්‍ය නොවන සංවිධානවල අවධානය යොමු

කිරීමෙහි ලා මෙම අභ්‍යාසය ප්‍රයෝජනවත් වුවත් සැබෑ ගැටලුව වී තිබෙන්නේ කල්ක්‍රියා සංග්‍රහයේ ජීව ගුණය හා නීතිරීති අකුරට ම ආරක්ෂා කිරීම බව යි.

එබැවින් CHA ආයතනය සහ බර්ගොෆ් පදනම ඒකාබද්ධ වී ත්‍රිකුණාමලයට දූත ගමනක් සිදු කිරීම මගින් ක්‍රියාවට නංවන්නන්ගේ අදහස් තහවුරු කර ගැනීම සඳහා උපදෙස් විමසීමේ ක්‍රියාවලිය තව දුරටත් දීර්ඝ කෙරුණි. GTZ ආයතනය මගින් **2005** පෙබරවාරි මස **13** වන දින "පශ්චාත්-සුනාමි උතුරු-නැගෙනහිර ප්‍රදේශයන්හි 'හානි නොකිරීම පිළිබඳ මූලධර්ම'වල හා ගැටුම් සංවේදිතාවෙහි අර්ථය" යන මැයෙන් ත්‍රිකුණාමලයේ දී පවත්වනු ලැබූ වැඩමුළුවක දී ආණ්ඩුව හා එල්ටීටීඊය, රාජ්‍ය නොවන සංවිධාන, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සංවිධානවලින් සහභාගි වූ නියෝජිතයන් අතර සංශෝධිත විවරණ සහිත ලියවිල්ලක් බෙදා දෙන ලදි.

CHA ආයතනය බර්ගොෆ් පදනම සමග සහයෝගීව **2005** පෙබරවාරි මස **14** වන දින සිට **19** වන දින දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කිරීමට භාර ගැනුණු අතර මෙහි පරමාර්ථය වූයේ විවරණ ලියවිල්ල බෙදා දීම, දේශීය හා ජාත්‍යන්තර ක්‍රියාවට නංවන්නන්ගේ උපදෙස් විමසීම හා ක්ෂේත්‍රය තුළ පැන නැගෙමින් පවත්නා ගැටලු හඳුනා ගැනීම යි. දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ද ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ආධාර දෙන්නන්, අලුතින් පැමිණි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්, අලුතින් පිහිටුවූ දේශීය රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශයේ සංවිධාන, කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් හා පුවත්පත් කලාවේදීන් ඇතුළු වෙනත් විවිධ පුද්ගලයන්ගේ ද උපදෙස් විමසීමට ඉලක්ක කරන ලදි. මෙහි දී සංවිධානවල නියෝජිතයන් විසිදෙදෙනෙකුගේ ද තනි පුද්ගලයන් ගණනාවකගේ ද උපදෙස් විමසිණ (කරුණාකර සපයා ඇති ලැයිස්තුව බලන්න).

දේශීය හා ජාත්‍යන්තර ක්‍රියාවට නංවන්නෝ මෙම විවරණවල අවශ්‍යතාව ද ඒ පිළිබඳව තමන් තුළ ඇති උනන්දුව ද තහවුරු කර පෙන්වා දුන්හ. මෙහි දී මෙම **(2005.02.13)** විවරණයන් තුළ තිබිය යුතු භාෂා භාවිතය පිළිබඳව මූලික කාරණා දෙකක් ඉස්මතු විය: දැනට ඇති විවරණයන්හි භාෂාව ඉතා මත් ශාස්ත්‍රීය බවකින් යුක්ත වන නිසා එය ඉංග්‍රීසි භාවිත කරන සාමාන්‍ය දේශීය ක්‍රියාවට නංවන්නන්ට පහසුවෙන් තේරුම් ගැනීමට අපහසු ය. අනෙක මෙම විවරණයන් සිංහල හා දෙමළ බසට පරිවර්තනය විය යුතු යැයි දේශීය ක්‍රියාවට නංවන්නෝ තව දුරටත් ඉල්ලා සිටියහ. අලුතින් ආරම්භ කරන ලද මානව සුභසාධන සංවිධානයන් ද තාක්ෂණික සේවකයන් ද ඇතුළත් දේශීය හා ජාත්‍යන්තර ක්‍රියාවට නංවන්නන්ට ප්‍රයෝජනවත් විය හැකි, වඩා ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ හා ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය කෙරෙහි සංවේදී අන්තර්ගතයක් විවරණ විසින් ඉල්ලා සිටින බව අවසානයේ සඳහන් විය.

දරිද්‍රතා හා සාමාජීය ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ හැකියාධාරිතා වර්ධනය (IMCAP) නමැති කොළඹ විශ්වවිද්‍යාලයීය වැඩසටහන සහ බර්ගොෆ් පදනම සමග සහයෝගීව CHA ආයතනය **2005** මැයි **2** වන දා සිට **4** වන දා දක්වා මාරවිල දී තවත් වැඩමුළුවකට අනුග්‍රහ දැක්වී ය. එය "පශ්චාත්-සුනාමි මානව සුහසාධන, යළි ගොඩ නැගීම් හා සංවර්ධන වැඩ කටයුතුවල යෙදී සිටින රාජ්‍ය නොවන සංවිධානවල සාම සංවේදී භාවය ඉහළ නැංවීම" යන මැයෙන් යුතු විය. වැඩමුළුවේ ඉලක්කය වූයේ සාමය හා සංවර්ධනය අතර වන සබඳතාවන් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමත් ගැටුම් තත්ත්වයන් තුළ කෙරෙන සංවර්ධනාත්මක මැදිහත් වීම්වල අනපේක්ෂිත බලපෑම් පිළිබඳව සහභාගිකයන් සංවේදී භාවයට පත් කිරීමත්, එමෙන් ම සංවර්ධන සැලසුම්කරණයේ දී සාම සංවේදී භාවය සඳහා ද ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල බලපෑම් තක්සේරුව සඳහා ද සහාය පිණිස මාර්ගෝපදේශ හඳුන්වා දීමත් ය.

වැඩමුළුවේ අවසාන දිනයේ දී කුඩා කණ්ඩායම්වලට බෙදී සියලු සහභාගිකයන් වෙත කල් තබා බෙදා දී තිබූ විවරණයන් සාකච්ඡාවට බඳුන් කරන ලදි. තමන්ගේ ව්‍යාපෘතිමය වැඩ කටයුතුවලට ඒවායේ ඇති අදාළත්වය හා මූලධර්ම යොදා ගැනීමේ දී බලපාන සීමාසහිත භාවයන් පිළිබඳව සාකච්ඡාව කේන්ද්‍රගත විය. විවරණයන් තව දුරටත් වැඩි දියුණු කරනු වස් විවේචණාත්මක ප්‍රතිපෝෂණයන් සම්පාදනය කරන ලෙස ද සහභාගිකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබුණි. ක්‍රියාවට නංවන්නන්ට තමන්ගේ විෂයීය අත්දැකීම්වලට එක් කොට ගත හැකි යෝග්‍ය රාමුසැකැස්මක් (පූර්ව භාවිතයන් අනුව සැකසුණු) විවරණ මගින් ප්‍රදානය කෙරුණු බවත්, එනයින් කල්ක්‍රියා සංග්‍රහයේ මූලධර්මවලට වඩාත් හොඳ අරුතක් ලැබෙන බවත් වැඩමුළුවේ අත්දැකීම්වලින් ප්‍රදර්ශනය විය. කණ්ඩායම් පුහුණු මගින් ලද අදහස් හා යෝජනා ද විවරණයන්ට ඒකාබද්ධ කොට ඇත.

**ඉදිරි මග**

මූලධර්ම හෝ කල්ක්‍රියා සංග්‍රහයන් මත පදනම් වන හෝ ඒවායින් මෙහෙයවෙන සාම සංවේදී සංවර්ධන මැදිහත් වීම් ක්‍රියාවට නැංවීම සිදු කළ හැක්කේ, විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජ්‍යායතනවල හොඳ මෙන් ම නරක පරිචයන් නිරීක්ෂණයට සහ වාර්තා කිරීමට ස්ථාපනය කළ පාලන ක්‍රමයක් වන එබඳු මාර්ගෝපදේශ වර්ධනය කිරීමත් ව්‍යාප්ත කිරීමත් සමග සමගාමී වූ විට පමණක් බව උපදෙස් විමසීමේ ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී සුපුරුදු කරුණක් ලෙස පෙන්වා දෙන ලදි. කෙසේ වුව, "මුර බල්ලන්" වැනි එබඳු ආයතනවල ස්ථාපිතයක් මගින් අවසන් වශයෙන් ඉල්ලා සිටිනු ඇත්තේ සංවර්ධන සංවිධානවල වෙනස් වූ කැප කිරීමකි, එනම් ක්‍රියාත්මක වීමේ මට්ටමේ දී නිශ්චිත මාර්ගෝපදේශවලට "දායක වීම" ම පමණක් නො ව විවිධ වූ යථාර්ථයන් පිළිබඳව කෙරෙන වාර්තා කිරීම් අනුව ක්‍රියාත්මක වීමට (ප්‍රතික්‍රියා කිරීමට) ද සිදු වන කැප කිරීමකි.

කෙසේ වතුදු, තමන් ක්‍රියා කරන පරිසරයෙන් ම ගත් නිදසුන් සාකච්ඡාවට ලක් කිරීමෙහි ලාත් එදිනෙදා ව්‍යාපෘති කටයුතුවල දී සියලු මූලධර්ම ක්‍රියාත්මක කිරීම නිරන්තරව අපහසු කරවන රාමුසැකසුම් කොන්දේසි පිළිබඳව දැනුවත්කම ඉහළ නැංවීමෙහි ලාත් IFRC/ICRC කල්ක්‍රියා සංග්‍රහයට කෙරෙන විවරණ ක්‍රියාවට නංවන්නන් උදෙසා ප්‍රයෝජනවත් වන බව සනාථ විය. මෙම අරුතින් ගත් කල, මෙතෙක් සිදු වූ උපදෙස් විමසීමේ සමස්ත ක්‍රියාවලියෙන් ම ලද ප්‍රතිපෝෂණයන් ඇතුළත් කර ගත් ඇඳන ලද සංශෝධිත විවරණයන්, විවිධ වූ කොටස්කරුවන්ට ශ්‍රී ලාංකික සන්දර්භයට අදාළ වන නිදසුන් හා පැහැදිලි කිරීම් තව දුරටත් එකතු කළ හැකි, ක්‍රියාවලියකින්-මෙහෙයවෙන ලියවිල්ලක් ලෙස දැක ගත යුතු ය.

# කල්ක්‍රියා සංග්‍රහය

**(2005 ජූනි)**

"ආපදා ප්‍රතිචාර වැඩසටහන්වල නියුතු රතු කුරුස රතු චන්ද්‍රවංක සමාජ ජාත්‍යන්තර සම්මේලනය (IFRC)/ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (ICRC) සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන කල්ක්‍රියා මූලධර්ම" පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය: <http://www.icrc.org/Web/Eng/siteeng0.nsf/html/57JMNB?OpenDocument> ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලැබූ කල්ක්‍රියා සංග්‍රහය මින් ඉදිරියට "IFRC/ICRC කල්ක්‍රියා සංග්‍රහය" ලෙස හඳුන්වනු ලැබේ.

IFRC/ICRC කල්ක්‍රියා සංග්‍රහයේ මුල් පිටපත කොටු තුළ වෙන් කර දක්වා ඇත. ශ්‍රී ලංකාවේ සුවිශේෂ පශ්චාත්-සුනාමි සන්දර්භය පිළිබිඹු කිරීමට උත්සාහ කරන විවරණයන් එක් එක් මූලධර්මයට පහළින් පෙළ ගස්වා ඇත.

## IFRC/ICRC කල්ක්‍රියා සංග්‍රහය සඳහා වන විවරණ

| |
|---|
| 1 වන මූලධර්මය: අත්‍යවශ්‍ය මානව සුහසාධන ප්‍රධාන තැන ගනී. මානව සුහසාධන ආධාර ලබා ගැනීමටත් ඒවා ලබා දීමටත් ඇති අයිතිය සියලූ රටවල සියලූ පුරවැසියන් ම භුක්ති විඳිය යුතු මූලික මානව සුහසාධන මූලධර්මයකි. ජාත්‍යන්තර ප්‍රජාවේ සාමාජිකයන් ලෙස, මානව සුහසාධන ආධාර අවශ්‍ය වන ඕනෑ ම තැනකට ඒවා සම්පාදනය කිරීම සඳහා වන අපගේ වගකීම අපි හඳුනා ගනිමු. ඒ අනුව එම වගකීමට උර දීමේ දී පීඩාවට පත් මහජනතාවන් වෙත බාධා රහිත ප්‍රවේශයක් තිබීමේ අවශ්‍යතාව මූලිකව වැදගත් වේ. ව්‍යසනය කෙරෙහි වන අපගේ ප්‍රතිචාරයේ ප්‍රාථමික අභිප්‍රාය වනුයේ ව්‍යසනයෙන් ඇති වූ පීඩාවන් දරා ගැනීමේ හැකියාව අවම වන්නන්ගේ දුක්වේදනාවන් තුනී කිරීම යි. අප මානව සුහසාධන ආධාර ලබා දෙන විට එය පක්ෂපාතී හෝ දේශපාලන ක්‍රියාවක් නො විය යුතු අතර එම කටයුතු කෙරෙහි එවැනි දෘෂ්ටියකින් බැලීම ද නො කළ යුතු ය. |

"අත්‍යවශ්‍ය මානව සුහසාධනය" තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වන්නේ පුද්ගලයන්ගේ, පවුල්වල හා ප්‍රජාවන්හි අවශ්‍යතා මත – ම – පදනම්ව මානව

සුහසාධන සහාය ලබා දෙන බව සහතික කිරීම හා එම මානව සුහසාධන සහාය අවශ්‍ය සියල්ලන්ට – සමානව – ඒවා ලබා දීම ය.

ශ්‍රී ලංකාවෙහි සුනාමිය හට ගත්තේ පසු ගිය දශක දෙක පුරා සමාජමය සුසංවාදයට හා ආර්ථික ක්‍රියාකාරිත්වයට යටින් වළ කපමින් ඇති අභ්‍යන්තර ජනවාර්ගික-දේශපාලනික ගැටුමකින් යන්තම් ආපසු හැරීමක් ඇති වූ තත්ත්වයට එරෙහිව ය. ශ්‍රී ලංකාවේ දී සුනාමි ව්‍යසනය, ආණ්ඩුව විසින් මුදා නොගත් ප්‍රදේශ ලෙස හැඳින්වෙන ඇත්ත වශයෙන් එල්ටීටීඊ පාලනය යටතේ පවතින දිවයිනේ ප්‍රදේශ ද ඇතුළුව උතුරුදිග, නැගෙනහිරදිග හා දකුණුදිග වෙරළ තීරයන් ඔස්සේ වෙසෙන ප්‍රජාවන් විනාශයට පත් කළේ ය.

සුනාමි විපත සෘජුව බලපා ඇති අය ද ඇතුළුව ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාවන්ගේ යහපැවැත්ම සඳහා සුහසාධනයන් සැපයීමේ දී, 2002 පෙබරවාරියෙහි සටන් විරාම ගිවිසුම (CFA) මගින් ස්ථාපනය කෙරුණු බිඳෙනසුලු සාමය ස්ථාවර භාවයට පත් කිරීමත් සාකච්ජාව තුළින් තිරසර විසඳුමක් ඇති කර ගැනීම සඳහා මං සෙවීමට ගන්නා උත්සාහයට දායක වීමත් අතිශයින් ම වැදගත් වේ. සුනාමි විපතින් පීඩාවට පත් වූවන්ට හදිසි මානව සුහසාධනයන් සපයමින් පිළියම් යෙදීම මගින් සහයෝගිතාවේ නව ස්වරූපයන් ආමන්ත්‍රණය කෙරී ඇතැයි ආණ්ඩුව ද එල්ටීටීඊයේ හා මුස්ලිම් ප්‍රජාවගේ නායකත්වය ද සතුට පළ කර ඇත.

විවිධ ජනවාර්ගික කණ්ඩායම් සුනාමිය හා රට තුළ පවතින්නා වූ ගැටුම්කාරිත්වය නිසා පීඩාවට පත්ව ඇත: වෙරළබඩ තීරයෙහි ජීවත් වන ඇතැම් ප්‍රජාවන් මෙම ව්‍යසන දෙකෙන් ම පීඩා විඳ තිබේ. ගැටුම නිසා සරණාගත කඳවුරු තුළ අවතැන්ව ජීවත් වූ ජනතාව සුනාමිය කරණ කොට ගෙන නැවත වරක් අවතැන් වූ අවස්ථා ද ඇත. මේ නිසා එම ජනයා ද්විගුණ අවතැන් වීමකට හා කම්පනයකට මුහුණ දී සිටිති.

සුනාමියේ හා අභ්‍යන්තර ගැටුම්කාරිත්වයේ ප්‍රතිඵල මගින් සීමිත සම්පත් සහිත කාන්තා මූලික කුටුම්බයන්ගේ සංඛ්‍යාව ඉහළ නැංවී ඇත: වෛද්‍යමය, සමාජමය හා ආර්ථිකමය පීඩාකාරී තත්ත්වයන් වර්ධනය කොට ඇත: සරණාගත කඳවුරුවල දී හා ප්‍රාදේශීය හුදෙකලා ස්ථානවල දී කාන්තාවන්, තරුණියන් හා ළමුන් වෙළඳ භාණ්ඩ බවට පත් වීමේ හා ඔවුන්ට එරෙහිව ලිංගික ප්‍රචණ්ඩත්වය යොදා ගැනීමේ හැකියාව වැඩි වී ඇත: පවුල් කැඩීබිඳී යාමේ ප්‍රශ්න සමග පොර බදන ප්‍රජාවන් හා පුද්ගලයන් ඉතිරි කොට ඇත: අවසානයේ ආබාධිතයන්, සංක්‍රමණික කම්කරුවන්, තරුණයන්, වැන්දඹුවන් හා අනාථ දරුවන් – තමන්ගේ අවශ්‍යතාවන් හා වර්ධනය ගැන සැලකිලිමත් වීමට සුදුසු (අනුග්‍රාහක) පවුලක් නොමැති ළමුන් – වැනි අනර්ථයට පත් අවතැන් වූ පුද්ගලයන් අසීමිතව බිහි කොට ඇත.

විවිධ ජනවර්ගයන්ට හා ආගම්වලට අයත් ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ විවිධ ප්‍රායෝගික අවශ්‍යතා හා ක්‍රමෝපායාත්මක උත්සුකතාවන් ආමන්ත්‍රණය කිරීමේ දී, ගැටුම් පසුපසින් බොහෝ ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ ජීවිත යළි හැඩ ගස්වමින් ඇති වූ වෙනස්කම් හඳුනා ගැනීම අත්‍යවශ්‍ය ය. සියල්ලේ ම නො වේ නම් බොහෝ ප්‍රදේශවල එදිනෙදා ජීවිතය අභ්‍යන්තර ගැටුම විසින් පීඩාවට පත් වී ඇත. සියලු ප්‍රජාවෝ මහත් කැලඹීමකට ගොදුරු වී සිටිති.

ආරාවුලට පත් පරිපාලන පද්ධති හා (නිල/නොනිල) දේශීය ව්‍යුහයන් වැනි ගැටුම්කාරී ආකෘතීන් අත්පත් කර ගත් පවත්නා ක්‍රියා දාමයෝ යුක්තිය පසිඳ ලීමේ සංස්ථාවන්ට අභියෝග කරන අතර පෙරදැකිය නො හෙන දේශපාලනික හා ආර්ථික වාතාවරණයන්, නිසග අන්තර්-වාර්ගික කැරලිකාරීත්වයන් හා මානව සුරක්ෂිත භාවය පිළිබඳ උත්සුකයන් පැන නංවති.

සම්පත් වඩාත් ඵලදායී ලෙසත් කාර්යක්ෂම ලෙසත් යොදා ගනිමින් විවිධ ප්‍රජාවන්ට අයත් ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ අවශ්‍යතාවන්ට හා අපේක්ෂාවන්ට ප්‍රතිචාර දැක්විය යුතු ය. එය සිදු විය යුත්තේ සමස්ත රට කෙරෙහි ම ද එහි බහුසංස්කෘතික හා එකිනෙකට වෙනස් වූ ජනතාව(න්) කෙරෙහි ද සංගත දැක්මක් පවත්වා ගන්නා අතරතුර ය: එමෙන් ම පුළුල් දෙශපාලනික, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික සන්දර්භයන්ට කේන්ද්‍රියව ස්ත්‍රී-පුරුෂ සමානතාව ප්‍රවර්ධනය කිරීම පිහිටුවන අතරතුර ය.

පශ්චාත්-ව්‍යසන ප්‍රයත්නයන්ට දිවයින තුළ සාමය සහ/හෝ ගැටුම් පිළිබඳ වඩා පුළුල් වූ ගතිකත්වයන් කෙරෙහි බලපැවැත්වීමට හැකියාවක් ඇති බව හඳුනා ගැනීම මෙහි දී වැදගත් වේ. බිඳෙනසුලු සාම වාතාවරණයක සිදු වන පශ්චාත්-ව්‍යසන ආධාර මගින් ආර්ථික සුරක්ෂිත භාවය, පුරවැසි අයිතීන් ආරක්ෂා කිරීම සහ දේශීය මානව සම්පත් සංවර්ධනය සමග අත්වැල් බැඳ ගත් සමාජමය සුසංවාදය ප්‍රවර්ධනය කළ යුතු ය. සහනාධාර, පුනරුත්ථාපන හා යළි ගොඩ නැගීමේ ප්‍රයත්නයන්හි දෙන ලද පවත්නා තත්ත්වය මගින් ජාත්‍යන්තර මානව සුභසාධන නීතිය හා අභ්‍යන්තර අවතැන් වූවන් (IDPs) සඳහා වූ මාර්ගෝපදේශන මූලධර්මයන් කෙරෙහි වන තමන්ගේ කැප වීමත් වගකීමත් ඒවායේ පාර්ශ්වකරුවන්ට සිහිපත් කෙරෙයි.

**2 වන මූලධර්මය**: ආධාර ලාභියාගේ වර්ගය, ආගම හෝ ඇදහීම හෝ, ජාතිකත්වය සැලකිල්ලට නො ගෙන හා කුමන ආකාරයක හෝ පීඩාකාරී වෙනස්කම් කිරීමකින්

තොරව ආධාර ලබා දෙනු ලැබේ. ආධාර සැපයීමේ ප්‍රමුඛතාවන් හඳුනා ගැනෙන්නේ අවශ්‍යතාව මත පමණක් පදනම් වී ගෙන ය. හැකි සෑම තැනක දී ම, විපතට ගොදුරු වූවන්ගේ අවශ්‍යතාවන් හා එම අවශ්‍යතා සැපිරීම සඳහා දැනට පවතින දේශීය හැකියාධාරිතාවන් පිළිබඳ පරිපූර්ණ තක්සේරුවක් මත අපි සහනාධාර සැපයීම පදනම් කරමු. අපගේ සියලු වැඩසටහන් තුළ අපි සමානුපාතිකත්වය පිළිබඳ උත්සුකතාවන් පිළිබිඹු කරමු. මානව දුක්පීඩාවන් දුටු තැන එය අඩු කිරීමට පියවර ගත යුතු ය: රටෙහි එක් කොටසකට නො ව හැම කොටසකට ම ජීවිතය ඉතා වටිනා දෙයක් වේ. මෙලෙස අපගේ ආධාර සැපයුමේ ප්‍රමාණය එය විසින් අඩු කිරීමට උත්සාහ ගන්නා දුක්පීඩාවන්ගේ තරම කොතෙක් දැයි පිළිබිඹු කරනු ඇත. මෙම පිවිසුම ක්‍රියාවට නැංවීමෙන් අපි ව්‍යසනයට භාජන වූ ප්‍රජාවන් තුළ කාන්තාවන් ඉටු කරන තීරණාත්මක කාර්ය භාරය හඳුනා ගන්නා අතර අපගේ ආධාර දීමේ වැඩසටහන් තුළ මෙම කාර්ය භාරය සුළු කොට තැකීම නො ව එයට සහාය දෙන බව අපි සහතික කරමු. මෙවැනි විශ්වීය, අපක්ෂපාතී හා ස්වාධීන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීම ඵලදායී විය හැක්කේ එබඳු සමතුලිත භාවයකින් සහනාධාර සැපයීම සඳහා අවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමටත් ව්‍යසනයට ගොදුරු වූ සියල්ලන් වෙත සමානව ප්‍රවේශ වීමටත් අපට සහ අපගේ කොටස්කරුවන්ට අවස්ථාව ඇත් නම් පමණි.

දෙවන මූලධර්මයෙහි අන්තර්ගතය තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වනුයේ

- කවර ආකාරයේ හෝ වෙනස්කම් කිරීමකින්/අනුග්‍රහ පූර්වක සැලකීමකින් තොරව ආධාර ලබා දිය යුතු ය
- ආධාර සහ සහාය සාධාරණ හා අපක්ෂපාතී විය යුතු ය
- "අවශ්‍යතා තක්සේරුවක්" හා "දේශීය හැකියාධාරිතා තක්සේරුවක්" මත ආධාර හා සහාය පදනම් කළ යුතු ය
- මානව සුභසාධන සහාය සැපයීමේ දී හා ඊට ප්‍රවේශ වීමේ දී ස්ත්‍රීහු අත්‍යවශ්‍ය ක්‍රියාකාරකයෝ වෙති
- මානව දුක්පීඩාවන් අවම කිරීම සඳහා අරමුදල් හා සම්පත් වෙත සාධාරණ ප්‍රවේශයක්

ශ්‍රී ලංකාව වනාහි ජනවාර්ගික කණ්ඩායම්වල, ආගම්වල හා සිරිත්විරිත්වල විවිධත්වයකින් යුක්ත අනේකත්වයෙන් සපිරි රටකි: ඊට කුලය ද එක් වේ. කුලය පිළිබඳ සංස්ථාපිත සමාජ ව්‍යුහය ආගමික අදහස් කපා හෙළමින් ශ්‍රී ලංකාවෙහි සෑම ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායමකට ම බලපෑම් කරයි. කුලමය හා පන්තිමය සංස්ථාපිතයන්,

ජනවාර්ගිකත්වය, ආගම හා ස්ත්‍රී-පුරුෂ සබඳතා යනු සමාජ වියමනෙහි කොටස් වන අතර ඒවා ප්‍රජාවන් තුළ හා ප්‍රජාවන් අතර වන වැදගත් ඇඟවුම්වලින් යුක්ත ය.

වෙනස්කම් නොකිරීමේ වාතාවරණයක් විසින් සමාජ-ආර්ථික හා දේශපාලනික දෘඪ භාවයන්ට ප්‍රතිරෝධය පාන අතර ව්‍යසනයෙන් විපතට පත් සියලු මහජනතාවගේ මානව දුක්පීඩාවන් අවම කිරීමේ දෘෂ්ටියෙන් යුතුව සහාය සැපයීම කෙරෙහි සාධාරණ හා අපක්ෂපාතී ප්‍රවේශය තහවුරු කිරීමට පරිශ්‍රම දරනු ලැබේ. දේශීය හා ජාත්‍යන්තර සංවිධානයන් සියලු ප්‍රජාවන්ට හා වෙරළබඩ ප්‍රදේශ කෙරෙහි, එමෙන් ම අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා වන කඳවුරු කෙරෙහි ප්‍රවේශය පිළිබඳ මූලධර්මය ආරක්ෂා කිරීම වැදගත් වන්නේ එම නිසා ය. මානව සුභසාධන ආධාර හා සහාය සපයන සංවිධානයන් ප්‍රජාවන් විසින් විශ්වාස කරනු ලැබීමත් දේශීය ආණ්ඩුව/පාලන ව්‍යුහයන් සහ/හෝ ජාත්‍යන්තරව පිළිගත් මානව සුභසාධන සංවිධානයන් විසින් හඳුනා ගනු ලැබීමත් සුවිශේෂව ම වැදගත් වේ.

ස්ත්‍රී-පුරුෂ භාවය, වයස, කුලය, ජනවර්ගය, ආගම, සමාජ-ආර්ථික තත්ත්වය, හෝ දේශපාලන අදහස්උදහස් නො තකා අපක්ෂපාතීව සැලකීම සහතික කළ යුතු ය; එනමුදු, එම තත්ත්වයන් මත පදනම් වෙමින් ම, කුටුම්බය තුළ ස්ත්‍රිය හා පුරුෂයා අතර තිබිය යුතු භෞතික ඉඩහසර මත සංස්කෘතිකව පැනවුණු ලිංගිකත්ව බෙදීම්, හෝ ගැහැණු හා පිරිමි ළමුන් මිනිස් වෙළඳ භාණ්ඩ බවට පත් කිරීමෙන් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා සුවිශේෂ ආරක්ෂක වැඩ පිළිවෙළවල් යෙදීම වැනි ලිංගිකත්වය සහ/හෝ වයස පිළිබඳ සැලකීම මත පදනම් වූ වෙනස් ක්‍රියාකාරකම් කර ගෙන යාම ඇතැම් විට අවශ්‍ය විය හැකි ය.

ව්‍යසනවලට පිළියම් යෙදීම සඳහා වූ දේශීය සුවිශේෂතාවන් කෙරෙහි අවධානය යෙදිය යුතු වන අතර මෙහි ලා ව්‍යසනය(න්) විසින් සෘජුව බලපෑම් කෙරී ඇති ප්‍රජාවන් වෙසෙන ප්‍රදේශවලට ප්‍රමුඛතාව දිය යුතු ය. මෙලෙස ජාත්‍යන්තර සංවිධාන, පිළිගත් හා නියෝජනාත්මක දේශීය කොටස්කරුවන් සමග, එනම් විශේෂයෙන් ම, පීඩාවට පත් පවුල්වල සාමාජිකයන්, අවිධිමත් හා අර්ධ-විධිමත් කාන්තා කණ්ඩායම්, දේශීය දේශපාලන හා පරිපාලන සංස්ථාපිතයන්, දේශීය රාජ්‍ය නොවන සංවිධාන හා දේශීය පෞද්ගලික අංශය සමග වැඩ කිරීමට නියමිත ය; එමෙන් ම ශ්‍රී ලංකාව තුළ සහ/හෝ ව්‍යසනය බලපෑ ප්‍රදේශවල බොහෝ කාලයක් තිස්සේ සිටින ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා ආධාර දෙන්නන් සමග ව්‍යුහාත්මක සම්බන්ධතා පිහිටුවා ගැනීමට නියමිත ය.

ස්ත්‍රී-පුරුෂ භාවය හා වයස ආදි වශයෙන් පැතිරුණු මානව විද්‍යාත්මක හා සමාජ-ආර්ථික දත්ත සහ තොරතුරු එක්රැස් කිරීමටත් ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳව සංවේදී දර්ශකයන් වර්ධනය කිරීමට හා පාරිසරික කළමනාකරණය සහ

ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය හා බැඳුණු ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ වෙනස්කම් විශ්ලේෂණය කිරීමටත් ව්‍යසන සංසිද්ධීන්, ඒ හා සම්බන්ධ වූ අලාභහානි/අවදානම් හා පීඩාවට පත් විය හැකි තත්ත්වයන් අඩු කර ගැනීමේ ක්‍රම හඳුනා ගැනීමටත්, එමෙන් ම භෞතිකමය හා සමාජමය යටිතල පහසුකම්වලට අදාළ හා හානි වැළැක්වීමට හා අඩු කිරීමට ඇති ඉඩකඩ තීරණය කර ගැනීමටත් ව්‍යසනය විසින් රට පුරා ඇති කෙරුණු මානව බලපෑම පිළිබඳ ජන සංගණන පදනම් කර ගත් "අවශ්‍යතා තක්සේරුවක්" පැවතීම වැදගත් වේ.

ජාත්‍යන්තර නියෝජ්‍යායතනයන්ගේ පැමිණීම මගින් දේශීය ප්‍රජාවන්, සංවිධාන හා ආයතන තමන්ගේ ප්‍රකෘතිකරණ වැඩසටහන් තුළ සිය ශක්තීන් හා සම්පත් යෙදවීම අධෛර්යමත් නො කළ යුතු ය. දේශීය ව්‍යුහයන් ආකර්ෂණය කර ගැනීමේ හා ශක්තිමත් කිරීමේ මාර්ග සහ ස්ත්‍රීන්ගේ රැකවරණය හා පුරුෂයන්ගේ ජීවනෝපායයන් හා පාරිසරික කළමනාකරණය උසස් කර ලීම පිණිස සහජ දේශීය ශක්‍යතාවන්, අත්දැකීම්, හා නිපුණතාවන් හඳුනා ගැනීම සඳහා "දේශීය හැකියාධාරිතා තක්සේරුවක්" ඉතා ම වැදගත් වේ.

**3** වන මූලධර්මය: තව ද, විශේෂිත දේශපාලනික හෝ ආගමික පිළිවෙතක් උදෙසා ආධාර යොදා ගනු නො ලැබේ. පුද්ගලයන්ගේ, පවුල්වල හා ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන් මත මානව සුභසාධන ආධාර ලබා දෙනු ලැබේ. රාජ්‍ය නොවන මානව සුභසාධන නියෝජ්‍යායතනවලට තමන් කැමති විශේෂිත දේශපාලනික හෝ ආගමික මතවාදයක් වැළඳ ගැනීමට ඇති අයිතිය තිබුණේ වුව ද එම මතවාදයන් කෙරෙහි ආධාර ලබන්නා තුළ වන භක්තිවන්ත භාවය මත ආධාර දීම රඳා නොපවතින බව අපි සහතික ලෙස කියා සිටිමු. අපි ආධාර පිළිබඳ පොරොන්දුව, ඒවා භාර දීම හෝ බෙදා හැරීම සුවිශේෂ දේශපාලනික හෝ ආගමික ඇදහීමක් වැළඳ ගැනීම හෝ පිළිගැනීම කෙරෙහි සම්බන්ධ නො කරමු.

තුන් වන මූලධර්මය තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වනුයේ අපක්ෂපාතී භාවය යි.

තුන් වන IFRC/ICRC මූලධර්මය ඉල්ලා සිටින්නේ අභ්‍යන්තර ගැටුමෙහි නියුතු පාර්ශ්වයන්ගේ ඉත්තන් ලෙස හෝ පාර්ශ්වයක් ලෙස සංවිධානයන් ක්‍රියා නො කළ යුතු බව යි. දුක්පීඩාවන්ගේ තරම හා අවශ්‍යතාවන්ගේ හදිසි භාවය සැලකිල්ලට ගනිමින් ආධාර අවශ්‍ය හැම කෙනෙකුට ම අපක්ෂපාතී ලෙස ආධාර ලැබෙන්නේ ය යන්න තහවුරු කිරීමට පරිශ්‍රම දැරිය යුතු බව යි. හමුදාව සමග සමීප ලෙස ක්‍රියා කරන සංවිධානයන් එසේ කිරීමේ දී හමුදාවේ හා සිවිල් වැසියන්ගේ වෙනස්කම්

පිළිබඳව නිරීක්ෂණය කරමින් අපක්ෂපාතී භාවය හා මධ්‍යස්ථ භාවය තුළින් විශ්වාසවන්ත භාවය ආරක්ෂා කර ගත යුතු ය.

විශේෂයෙන් ම දශක දෙකක පමණ අභ්‍යන්තර ගැටුම්කාරී තත්ත්වයක් අත්විඳ ඇති ශ්‍රී ලංකාව වැනි රටක පශ්චාත්-ව්‍යසන ආධාර සපයන සංවිධානයන්ගේ නීත්‍යානුකූල භාවය සඳහා අපක්ෂපාතී ක්‍රියාකාරිත්වය අත්‍යවශ්‍ය වේ. එම නිසා එය සුවිශේෂ දේශපාලනික හෝ ආගම්-පාදක මතවාදයන් තව දුරටත් පෙරට ගෙන යන කොන්දේසි සහගත භාවයන් මත ආධාර භාවිතයට ගැනීම හෝ පදනම් කිරීම නො කළ යුතු ය. එක් ප්‍රජාවක් හෝ සමාජ කණ්ඩායමක් තනි කර ශ්‍රී ලාංකික ජනතාවන් වාර්ගික-දේශපාලනික හෝ ආගම්-පාදක බෙදුම්කඩනයන් ඔස්සේ තව දුරටත් බෙදා ලීමේ අවදානම මගින් මේවාට ආතතියට හා ගැටුමට දායක විය හැකි ය.

පශ්චාත්-ව්‍යසන තුරන් කිරීමේ ප්‍රයත්නයන් පීඩාවට පත් සමස්ත ප්‍රජාවගේ විශ්වාසය තුළ මුල් බැස ගත යුතු ය. සියලු ම ස්ත්‍රීන්ගේ ද පුරුෂයන්ගේ ද ඕනෑඑපාකම් හඳුනා ගෙන සරිලන අන්දමින් පිරිමැසිය යුතුව ඇත: එසේ කිරීමේ දී ආබාධිතයන්, යුද්ධය නිසා වැන්දඹු බවට පත් කාන්තාවන්, සංක්‍රමණික කම්කරුවන්, තරුණයන්, ළමුන් සහ කාන්තා-මූලික කුටුම්බයන් ද ඊට ඇතුළත් කළ යුතු ය. පීඩාවට පත් ජනතාවන් සමග වැඩ කරන, සමබර ස්ත්‍රී-පුරුෂ සහභාගිත්වයෙන් යුත් කණ්ඩායම්වලට කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රකෘතිකරණ හා යළි ගොඩ නැගීමේ වැඩ කටයුතුවල නිරතව සිටින "සියල්ලන්ගේ" අවශ්‍යතා හා අපේක්ෂාවන් නිසි පරිදි ආමන්ත්‍රණය කළ හැකි වේ.

දේශීය දුක්ගැනවිලිවලට මුහුණ දීම සඳහා ප්‍රජාවන් අතර දැන් පවත්නා සංවාදයට, ආධාර අවැසි ප්‍රදේශ තුළ තිරසර හා සාමකාමී සහපැවැත්මක් ඇති වීම පහසුකම්කරණය කළ හැකි ය. එම නිසා ආධාර දීම දේශීය ප්‍රජාවන් තුළ ද රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා ජාත්‍යන්තර) හා දේශීය පරිපාලන ව්‍යුහයන් අතර ද විශ්වාසය ගොඩ නැගීම ඉලක්ක කර ගත යුතු ය. එක්ව වැඩ කිරීමට, එකිනෙකා කෙරෙහි ඉවසිලිමත් භාවය ප්‍රවර්ධනය කිරීමට, වෙනස්කම් කිරීමට එරෙහිව සටන් කිරීමට, සංස්කෘතික වෙනස්කම්වලට හා ආගමික විවිධත්වයට ගරු කිරීමට ප්‍රජාවන්ට ඉඩ සලසා දීමටත්, වඩා සුරක්ෂිත ප්‍රජාවන් වර්ධනය කිරීමෙහි ලා සහ පශ්චාත්-සුනාමි ප්‍රයත්නයන්ගේ ප්‍රාදේශීය හා ජාතික ප්‍රමුඛතාවන් නිර්ණය කිරීමෙහි ලා ස්ත්‍රීන් පූර්ණ සහ සමාන කොටස්කරුවන් බවට පත් කිරීමටත් යාන්ත්‍රණයන්ට සහාය විය යුතු ය.

4 වන මූලධර්මය: ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තියට ගැති වී ක්‍රියා නොකිරීමට අපි හැම උත්සාහයක් ම ගනිමු. රාජ්‍ය නොවන මානව සුභසාධන නියෝජ්‍යායතන ආණ්ඩුවෙන් ස්වාධීනව ක්‍රියා කරන නියෝජ්‍යායතනයන් ය. එම නිසා අපි අපගේ ම ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක වීමේ ක්‍රමෝපායයන් සූත්‍රගත කරන්නෙමු: අපගේ ම ස්වාධීන ප්‍රතිපත්තීන් හා සැසඳෙන අවස්ථාවල දී හැර කිසි ම ආණ්ඩුවක ප්‍රතිපත්තීන් ක්‍රියාවෙහි යෙදවීමට උත්සාහ නොකරන්නෙමු. අපි දැනුවත්කමින් – හෝ නොසැලකිල්ලෙන් – අප ම හෝ අපගේ සේවකයන් උපයෝගි කර ගනිමින් ආණ්ඩුවලට හෝ වෙනත් කණ්ඩායම්වලට සැබෑ වශයෙන් මානව සුභසාධනමය නොවන වෙනත් අරමුණු සඳහා සේවය කළ හැකි දේශපාලනික, හමුදාමය හෝ ආර්ථිකමය වශයෙන් සංවේදී තත්ත්වයක් පිළිබඳ තොරතුරු එකතු කිරීමට වත්, ආධාර දෙන ආණ්ඩුවල විදේශ ප්‍රතිපත්තියේ ඉත්තන් ලෙස ක්‍රියාත්මක වීමට වත් කිසි දා ඉඩ නො දෙමු. අපි අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා අපට ලැබෙන්නා වූ ආධාර යොදා ගන්නා අතර, මෙම ආධාර ලබා දීම තම වෙළඳ භාණ්ඩ අතිරික්තයන්ගෙන් නිදහස් වීම සඳහා ආධාර දෙන්නන්ට වන අවශ්‍යතාවෙන් වත් කුමන හෝ සුවිශේෂ ආධාර දෙන්නෙකුගේ දේශපාලන අවශ්‍යතාව මගින් වත් නො මෙහෙයවිය යුතු ය. බලවත් උනන්දුවකින් යුත් පුද්ගලයන් අපගේ කටයුතුවලට සහාය වීම සඳහා ස්වේච්ඡාවෙන් ශ්‍රමය හා මුදල් ලබා දීම අගය කරන අතර අපි එය ප්‍රවර්ධනය කරමු: එමෙන් ම එබඳු ස්වේච්ඡාමය පෙළඹවීමකින් අනුබල ලැබෙන ක්‍රියාකාරකමක ඇති ස්වාධීනත්වය හඳුනා ගනිමු. අපගේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම පිණිස තනි අරමුදල් මූලාශ්‍රයක් මත පදනම් වීමෙන් වැළකීමට අපි උත්සාහ කරමු.

හතර වන මූලධර්මය තුළ පවත්නා මූඛ්‍ය කාරණාව වන්නේ ආණ්ඩුවෙන් හෝ ආණ්ඩුවලින් ස්වාධීන වූ සංවිධානයන් ලෙස රාජ්‍ය නොවන/පරිපාලනමය නොවන සංවිධානයන් පිළිබඳව සැලකීම යි.

- ස්වාධීන ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක වීමේ ක්‍රමෝපායයන්
- අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම
- භාණ්ඩ අතිරික්තයෙන් නිදහස් වීම සඳහා ආධාර දෙන්නන් කරන කටයුතුවලින් නො මෙහෙයවිය යුතු ය
- එක් අරමුදල් මූලාශ්‍රයක් මත පදනම් වීමෙන් වැළකීම

හතර වන IFRC/ICRC මූලධර්මය අවධාරණය කරන්නේ රාජ්‍ය නොවන සංවිධාන ආණ්ඩුවෙන්/පරිපාලනමය න්‍යාය පත්‍රවලින් ස්වාධීනව ක්‍රියා කරන බව යි. එය මානව සුහසාධන සහායෙහි, සාමයෙහි හා ආරක්ෂාවෙහි ලා රාජ්‍ය නොවන/පරිපාලනමය නොවන, ලාභ නොලබන සංවිධාන ඉටු කරන වැදගත් කාර්ය භාරය සඳහන් කරයි. මානව ව්‍යසන තත්ත්වයන්හි දී රාජ්‍ය නොවන සංවිධානයන් පුද්ගලයන්ගේ, පවුල්වල හා ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීම පමණක් ඉලක්ක කර ගත් ස්වාධීන පිළිවෙත් හා ක්‍රියාත්මක වීමේ ක්‍රමෝපායයන් දරා සිටීමත් එම ආධාර මානව සුහසාධන සහාය අවශ්‍ය සියල්ලන් වෙත සමානව බෙදා හැරීමත් අත්‍යවශ්‍ය දෙයක් වේ.

මානව සුහසාධන රුකවරණය හා සහාය අවැසි සියල්ලන්ගේ අවශ්‍යතාවන්ට කඩිනමින් හා නම්‍යතාවෙන් යුතුව ප්‍රතිචාර දැක්වීම සඳහා සියලු දෙනාගේ ප්‍රයත්නයන් ඒකාබද්ධ කළ යුතු යැයි පවත්නා තත්ත්වය කැඳවුම් කර සිටී. පශ්චාත්-සුනාමිය තුළ අංශය විසින් පරිපාලනය කෙරෙන පෙර නොවූ විරූ අරමුදල් ප්‍රමාණය හා බැඳී සංඛ්‍යාත්මක බව හා බලපෑම් සහගත බව යන දෙඅතින් ම දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන්හි දර්ශකමය වැඩීමක් සිදුව ඇති අතර එය රටට නව අභියෝගයන් මාලාවක් නිර්මාණය කර ඇත.

ව්‍යසනය(න්) සමස්ත රට ම – සියලු මට්ටම්වල දී – පීඩාවට පත් කර ඇත, එම නිසා, ස්ථාපිත රාජ්‍ය නොවන සංවිධාන (දේශීය හා ජාත්‍යන්තර) තම සුවිශේෂ කැප වීම් පවත්වා ගෙන යාම හා සුනාමියට පෙර සිට තමන් කර ගෙන එන්නා වූ වැඩ කටයුතුවල සන්දර්භය තුළ සුනාමියෙන් ඇති වූ බලපෑම් ආමන්ත්‍රණය කිරීමත්, එසේ කිරීමේ දී තමන් සතු සංසන්දනාත්මක වාසි සහගත තත්ත්වයන් ප්‍රයෝජනයට ගැනීමත් වැදගත් වේ.

ස්ථාපිත රාජ්‍ය නොවන සංවිධාන තමන්ගේ සංවිධානමය කැප වීම් හා ආයතනික අරමුණු සුනාමි-මූලික කේන්ද්‍රයක් වෙත මාරු කිරීමේ නැඹුරුවක් පශ්චාත්-සුනාමි සන්දර්භය විසින් පෙන්නුම් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාවෙහි රාජ්‍ය නොවන සංවිධාන අංශය, අභ්‍යන්තර හැකියාධාරිතාවන් සුළු වශයෙන් පවතිද්දී හෝ නැති තත්ත්වයේ දීත් සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දෙසට වූ මග හැරිය නොහැකි මාරු වීමක් අත්දැක තිබේ. තාක්ෂණික සහාය පිළිබඳ පූර්ව අත්දැකීමක් නැතිව යළි ගොඩ නැගීමේ හා සංවර්ධන කටයුතුවල ක්‍රියාත්මකව යෙදී සිටින රාජ්‍ය නොවන සංවිධාන හා/හෝ අප්‍රකට පුද්ගලයන් මුහුණ දෙන මධ්‍ය හා දිගු කාලීන අවදානම් හා අනිටු විපාක සැලකිල්ලට ගනු වටී. පුනරුත්ථාපනය හා තිරසර සංවර්ධනය පිළිබඳ අප්‍රමාණ වූ ද විවිධාකාර වූ ද කාරණා වනාහි විශේෂඥ භාවය හා සම්බන්ධ අතිශය සංකීර්ණ ක්ෂේත්‍රයකි. අදාළ විශේෂඥයන්ගෙන් තොරව පුද්ගලයන් හා සංවිධාන විසින් ගන්නා ලද මූලාරම්භකත්වයන් මගින් සමාජ, ආර්ථික

හා සාමය හා සම්බන්ධ උත්සුකයන් කෙරෙහි කෙටි, මධ්‍ය හා දිගු කාලීන අහිතකර සංඝට්ටනාත්මක ප්‍රතිවිපාක අත් කර දිය හැකි ය.

සුනාමියෙන් පසු සමයේ රාජ්‍ය නොවන සංවිධාන රජයේ ලියාපදිංචි කිරීම අත්හිටුවීම කරණ කොට ගෙන මේ මොහොතේ රට තුළ පවතින අලුතින් පැමිණි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා අලුතින් ස්ථාපිත දේශීය රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව කොපමණ දැයි කිසිවෙක් නො දනිති. පුනරුත්ථාපන ක්‍රියාවලියට සහභාගි වීමේ අවස්ථාව පැහැදිලිව ම ඉල්ලුම් කරමින් පෙරට පැමිණි අප්‍රකට පුද්ගලයන්ගේ අතිශය අසාමාන්‍ය හා නිසග ඉදිරිපත් වීම ද ඊට එක් කළ යුතු ය. මෙම නව ක්‍රියාකාරකයන් පිරිස අතරට කිසිදු සුවිශේෂ සමාජමය ක්‍රියාකාරිත්වයක සංවිධානගත වීමක් වත් කිසිදු මානව සුභසාධන සංවිධානයක් සමග අනිවාර්ය සම්බන්ධතාවක් වත් නැති, එනමුදු දිවයිනේ වෙරළබඩ ප්‍රදේශ කෙරෙහි සුවිශේෂ අවධානයකින් යුක්තව පෙරට පැමිණ ඇති තනි තනි ශ්‍රී ලාංකිකයන්, ශ්‍රී ලාංකික නොවන පුද්ගලයන් හා විදේශීය ආගන්තුකයෝ ඇතුළත් වෙති.

පුනරුත්ථාපන ක්‍රියාවලිය හා සම්බන්ධව මෙම නව ක්‍රියාකාරකයන්ගේ (තනි පුද්ගලයන්ගේ හා නව රාජ්‍ය නොවන සංවිධානවල) විධිමත් අරමුණු කවරේ ද යන්න, ඔවුන්ගේ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායයන් මොනවා ද, ඔවුන් සැපයීමට ඉලක්ක කරන ආධාරවල ස්වරූපය කුමක් ද, කොපමණ කලක් ඔවුන් මෙහි යෙදී සිටීමට අදහස් කරන්නේ ද යන්න හා පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය තාක්ෂණික/ආයතනික හැකියාධාරිතාවන් ඔවුන් සතුව තිබෙන්නේ ද නැද්ද යන්න, එසේ නම්, තිරසර භාවය පිළිබඳව හා දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල සහක්‍රියාකාරිත්වය පිළිබඳව අවධානය යොමු කිරීමක් වැනි ක්‍රියා පිළිවෙත් සඳහා වූ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කිරීමට ඔවුන් අදහස් කරන්නේ ද නැද්ද යන්න, හෝ සමාන දේශීය සංවිධානමය යාන්ත්‍රණයන් හා බැඳී කටයුතු කිරීමට කැමැත්තක් ඇද්ද නැද්ද යන්න යන මේ එකක් වත් නිශ්චිතව පැහැදිලි නැත.

පශ්චාත්-සුනාමි කාල පරිච්ඡේදයෙහි දේශීය ප්‍රජා මූල සංවිධානයන්හි වෙනසක්, එනම් සහනාධාර සැපයීමට නැඹුරු වූ රාජ්‍ය නොවන සංවිධාන බිහි වීමක් දැකිය හැකි විය. ඇතැම් ඒවා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ලැබුණු ව්‍යසන සහනාධාර අරමුදල් උරා බී ඇද ගැනීමේ/අත්පත් කර ගැනීමේ අරමුණෙන් පිහිටුවී ඇති බව පෙනී ගියේ ය. අනෙක් ඒවාට අව්‍යාජ මානව සුභසාධන අරමුණු තිබිය හැකි ය. කෙසේ වුව ද, අලුතින් පිහිටුවුණු දේශීය රාජ්‍ය නොවන සංවිධානයන්ගේ හැකියාධාරිතාව, වගකීම් සහගත භාවය, වර්ධනය වීමේ තිරසර භාවය හා විශේෂයෙන් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමග එක්ව ක්‍රියා කිරීමේ දී ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයන් – ඔවුන්ගේ ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක වීමේ

ක්‍රමෝපායයන් ද ඇතුළත්ව – පරීක්ෂාවට ලක් කිරීම වැදගත් වේ.

සහාය හා ආධාර මෙහෙයවිය යුත්තේ බැහැරින් එල්ල වන පීඩනයෙන් නො ව දේශීය අවශ්‍යතා කෙරෙහි දැක්වෙන ප්‍රතිචාරයක් මගිනි. ආධාර බෙදා දීමේ දී දේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීමට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවලට පීඩනයක් එල්ල විය හැකි බවක් පවත්නා තත්ත්වයෙන් ඇඟවුම් කෙරෙයි. කෙසේ වුව ද දේශීය රාජ්‍ය නොවන සංවිධාන සිටින්නේ දුර්වල තත්ත්වයක ය.

එම නිසා විශේෂයෙන් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන දේශීය මූලාරම්භකත්වයන් වෙනුවට ආදේශක ඉදිරිපත් කිරීමට වඩා ඒවා වඩා ශක්තිමත් කිරීමට පහසුකම් සැලසීම අත්‍යන්ත වැදගත්කමක් අත් කර ගනී. එසේ කිරීම සඳහා, බාහිර සහ දේශීය කොටස්කරුවන්, විශේෂයෙන් කාන්තා කණ්ඩායම් හා සංවිධාන, ඍජුව හෝ නොසැලකිලිමත්කමින් රටෙහි පිතෘ/මාතෘ ව්‍යුහාත්මක වෙනස්කම් හා බැඳුණු ව්‍යුහයන් ප්‍රවර්ධනය කරනවාට වඩා එක්ව උගෙනීමේ අවශ්‍යතාවක් පවතී.

ඔවුන් අත්දැකිය හැකි දේ දැන ගැනීමට සිතා ස්ත්‍රී-පුරුෂ සමාජමය කාර්ය භාරයන් හා සබඳතා පිළිබඳව කරන ආකාරගත අර්ථනිරූපණයන් මත නො ව කාන්තාවන් හා පිරිමින් සැබවින් ම අත්දකින්නේ කුමක් ද යන්න පිළිබඳ සන්දර්භ-විශේෂී සාක්ෂ්‍ය මත මානව සුභසාධන ප්‍රයත්නයන් පදනම් විය යුතු ය. සියලු ගැහැණුන් හා පිරිමින් සමාන ආකාරයකින් ව්‍යසනයෙන් පීඩාවට පත් නුවූයේ ය යන්න තහවුරු කිරීම වැදගත් වේ. යම් විශේෂ ජනවාර්ගික කණ්ඩායමක් දෙන ලද ප්‍රදේශයක තමන්ට හිමි වී ඇති සුලුතර තත්ත්වය හේතුවෙන් අද්දරට තල්ලු වී යාමක් අත්දකිනු විය හැකි ය. එම නිසා රාජ්‍ය නොවන සංවිධානවල මැදිහත් වීම් තුළින්, සහාය සැපයෙන ප්‍රදේශයෙහි(යන්හි) සියලු ප්‍රජාවන්ට අයත් දේශීය කාන්තාවන් හා පිරිමින් විසින් පකාශයට පත් කරනු ලබන උත්සුකතාවන් හා ප්‍රමුඛතාවන් පිළිබිඹු කළ යුතු ය.

| |
|---|
| **5** වන මූලධර්මය: අප සංස්කෘතියට හා සිරිත්විරිත්වලට නිරතුරුව ම ගරු කළ යුතු ය. අප වැඩ කරන්නා වූ ප්‍රජාවන්ගේ ද රටවල ද සංස්කෘතියට, ව්‍යුහයන්ට හා සිරිත්විරිත්වලට ගරු කිරීමට අපි වැයම් කරන්නෙමු. |

පස් වන මූලධර්මය තුළ පවත්නා මූඛ්‍ය කාරණාව වනුයේ සංවේදී භාවය හා සියලු දේශීය සිරිත්විරිත් හා ව්‍යුහයන්ට ගරු කිරීම යි.

පස් වන IFRC/ICRC මූලධර්මයෙන් සංස්කෘතියට, ව්‍යවහාර භාෂාවන්ට ගරු කිරීමක් හා සියලු ආගම් හා ජනවාර්ගික කණ්ඩායම් ඉවසා සිටීමට පුරුදුපුහුණු වීම ඉල්ලා සිටී. පෙරට යන ජනවාර්ගික-දේශපාලනික ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස ආගම හා ජනවාර්ගිකත්වය සමග සම්බන්ධ වූ උත්සුකතාවන් විශේෂයෙන් ම සංවේදී භාවයට පත්ව ඇත. ශ්‍රී ලාංකාවෙහි වන ආගමික, ජනවාර්ගික හා ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ ප්‍රශ්න මගින් සංකීර්ණ හා සමාජ විද්‍යාත්මක ඇඟවුම් සහිත ගතිකත්වයන් ආමන්ත්‍රණය කෙරෙන අතර ඒවා අනන්‍යතාව පිළිබඳ වියමනට ම ආත්මීය ලෙස සම්බන්ධ බව පෙනී යනු ඇත.

එවැනි සංවිධානයන් ප්‍රජා-පාදක, සාමාජීය සහ/හෝ රට ම අළලා ගත් අස්ථාවර භාවයක භය සන්ත්‍රාසයන් සමග හවුල් වන නිසා ම, එමෙන් ම ඇතැම් සිදුවීම්වල දී සුවිශේෂ ජනවාර්ගික සහ/හෝ ආගමික කණ්ඩායම්වල සංස්කෘතීන් සමග පරස්පර-විරෝධී යැයි දකිනු ලැබෙන නිසා ම, ආගම පාදක කර ගත් රාජ්‍ය නොවන සංවිධාන – විශේෂයෙන් ම බාහිර මූලාශ්‍ර විසින් අරමුදල් සැපයෙන සංවිධාන – පිළිබඳ දේශීය දැක්ම අතිශය වැදගත් කරුණක් බවට පත් වේ.

පොදු විශ්වාසය නම් ආගම්-පාදක සංවිධාන සිත යොමු කරන්නේ ආගම නියෝජනය කරන පුද්ගලයන් වෙත පමණක් බව යි: සහ/හෝ දරිද්‍රතාව අත්දකින, අධ්‍යාපනයට අඩු ප්‍රවේශයක් ඇති, බඩගින්න සහ පෝෂණය, සනීපාරක්ෂාව, හා සෞඛ්‍යය පිළිබඳ ගැටලු ඇති පුද්ගලයන්ට මූල්‍යමය හා වෙනත් ආර්ථිකමය දිරි දීම් පිළිගැන්වීමෙන් මුලා කොට ඔවුන් තම ආගමට හරවා ගැනීමෙහි යෙදී සිටින බව යි. අඛණ්ඩ සහායක් හෝ වඩා හොඳ සහායක් – ඉඩමක්, පොහොර, බීජ මිල දී ගැනීමට මුදල්, ළමුන් සඳහා නොමිලේ අධ්‍යාපනය, සහ ආහාර – පිරිනැමෙන්නේ විධිමත් ආකාරයෙන් එම සුවිශේෂ ආගමට සම්බන්ධ වූ ජනතාවට පමණක් ය යන තවත් සැකයක් ද පවතී.

විශ්වාසයකින් හෝ ආගමකින් කැමැත්තෙන් ඉවත් වනවාට වඩා, වුවමනාවෙන් හෝ අවශ්‍යතාවෙන් තොරව යම් සුවිශේෂ ආගමකට මහජනයා හරවා ගැනෙන්නේ ය යන පොදු මතය තහවුරු කිරීමට තරම් ප්‍රමාණවත් සංඛ්‍යාත්මක තොරතුරු නොමැත. කෙසේ වුව ශ්‍රී ලංකාව තුළ එබඳු මානයකට පත්ව ඇති මෙම ප්‍රශ්නය ගැන ආණ්ඩුවේ සාකච්ඡා කව තුළ සැලකිය යුතු විවාදයක් සිදු වෙමින් තිබෙන බව සටහන් කර ගැනීම වැදගත් ය. එම නිසා ශ්‍රී ලාංකාව තුළ මානව සුභසාධන සහාය සම්පාදනය කරන දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සඳහා මෙම පස් වන මූලධර්මය විශේෂයෙන් වැදගත් වේ.

ඇතැම් විට ගැටුම් ඇති වීමට වැඩි වන ඉඩප්‍රස්තාවක් හා සමාජ හා දේශපාලන අස්ථාවරත්වයේ වැඩි වන අවදානමක් ගෙන එනු හැකි ආගම්-පාදක රාජ්‍ය නොවන සංවිධානයන් දැවැන්ත ලෙස දර්ශන පථයට පැමිණීමක් පශ්චාත්-සුනාමියෙහි දැක ගත හැකි වී ඇත. එම නිසා විනිවිද භාවයෙන් යුතු හා වටහා ගත හැකි යාන්ත්‍රණයන් පවත්වා ගෙන යාමට සහ සංවිධාන හා ඒවායේ ක්‍රියාකාරකම් වටා කවරාකාරයක හෝ රහස්‍ය ස්වභාවයක් ඇති වීමේ තත්ත්වයන් ඉවත් කිරීමටත් එමගින් සාමාන්‍ය මහජනතාවගේ සැකසංකා පෝෂණය කිරීම වැළැක්වීමටත් අන්තර්-ආගමික සංවාදයක් ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ. කවර හෝ ආගම්-විශේෂී ක්‍රියාකාරකමක යෙදී සිටින රාජ්‍ය නොවන සංවිධාන, වෙනත් ආගමක ප්‍රජාවන් බහුල ලෙස වාසය කරන ප්‍රදේශවල ආගම පදනම් කර ගත් ගොඩනැගිලි ඉදි නොකිරීම බඳු සුවිශේෂ පූර්වෝපායයන් සඳහා තව දුර පියවර ගත යුතු ය.

ඉංග්‍රීසි භාෂා ඥානය පිළිබඳ ගැටලු හේතු කොට ගෙන දේශීය කොටස්කරුවන් බැහැර විය හැකි වීම වැනි සැලකිල්ලට ගත යුතු වෙනත් සංස්කෘතික-සංවේදී උත්සුකතාවන් ද පවතී; එසේ ම දේශීයව පිළිගත් පරිවර්තකයන් සිටීම හා දේශීය භාෂාවන් සම්බන්ධයෙන් ප්‍රමිතිගත පරිවර්තනයන් සඳහා පාරිභාෂික වදන් මාලාවක් පැවතීම අවශ්‍ය ය.

විශේෂයෙන් ස්ත්‍රී-පුරුෂ සබඳතා හා සුවිශේෂ ප්‍රජාවන් සහ/හෝ ජනවාර්ගික කණ්ඩායම්ගත වීම් ආශ්‍රිත අනන්‍යතාවන් සම්බන්ධිතව ගත් කල, දිවයිනේ සමාජ වියමන තුළට කා වැදුණු ගැටුම් ගතිකයන් සමග බැඳුණු සන්නද්ධ සංස්කෘතියකට දිවයිනේ අභ්‍යන්තර ගැටුම දායක වී ඇති බව ගැන දැනුවත් වීම ද වැදගත් වේ. හමුදා ශක්තිය, යුද්ධ, බෝම්බ හෙළීම්, හා අලාභහානි පිළිබඳව අවධානය යොමු කිරීමට යුද්ධය පිළිබඳ ප්‍රමිතිගත වාර්තා උපකාර වෙයි. කෙසේ වුව ද, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ විශ්ලේෂණය හා මානව හිමිකම් ප්‍රමිතීන් අනැතිව යුද්ධයේ දේශපාලනය තක්සේරු කිරීම; හා ස්ත්‍රී භාවය සහ පුරුෂ භාවය, පවුල පිළිබඳ සංකල්ප, ජනවාර්ගිකත්වය, ආගම හා ආබාධිතත්වය, එමෙන් ම සමාජ වගකීම පිළිබඳ ගැටලු හා සම්බන්ධ උත්සුකතාවන් තුළින් සමාජයන් මිලිටරිකරණය වීම පිළිබඳ පැතිකඩ සැලකිල්ලට ගැනීම තීරණාත්මක ය.

ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තර හා සන්නද්ධ ගැටුමේ දශක දෙකක ගමන් මගේ දී, රටේ කාන්තාවන් සන්නද්ධ සටන්කරුවන් වැනි භූමිකාවන්ට පිවිසී ඇත, ප්‍රධාන ආදායම් උපයන්නන් හා කුටුම්බයේ මූලිකයන් බවට පත් වී ඇත. "සාම්ප්‍රදායික" යැයි කියන ලද ස්ත්‍රී-පුරුෂ සමාජ සබඳතාවන්හි ගතිකයන් නාටකාකාරව වෙනස් වී ඇත. එම නිසා කාන්තාවන් මත ව්‍යසනයන් මගින් ඇති කළ බලපෑම තක්සේරු කිරීම ඉමහත් වැදගත්කමක් ගනී; එමෙන් ම පශ්චාත් සන්නද්ධ අරගලය තුළ කාන්තාවන්

බල ගැන්වීම පිළිබඳ ප්‍රශ්න, ගැටුම් බලපෑ කාන්තාවන් පිරිස සම්බන්ධයෙන් සුනාමිය බලපෑ ආකාරය, සහ කාන්තාවන් කෙරෙහි සාමයේ හා සටන්කරුවන්/හමුදා කාර්ය මණ්ඩලය ප්‍රජාවන් කරා යළි පැමිණීමේ ඇඟවුම් පිළිබඳව අවධානය යොමු කිරීම විශේෂයෙන් ම උචිත ය.

අභ්‍යන්තර ගැටුමෙහි ප්‍රතිඵලයක් ලෙස දූෂණය හා වධ දීම වැනි ප්‍රචණ්ඩත්වයෙන් පීඩා විඳ ඇති කාන්තාවන් හා පිරිමින්ගේ අවශ්‍යතා විසින් විශේෂ සැලකිල්ලක් ඉල්ලා සිටීම ද ඊට ම එක් කළ යුතු ය. දිවි ගලවා ගත්තවුන් උදෙසා ප්‍රකම්පනය සඳහා වූ මනෝ විද්‍යාත්මක උපදේශනය ලබා දීම අවතක්සේරු නො කළ යුතු අතර එය ආහාර හා වාසස්ථාන සුරක්ෂිත කිරීම සමග සමාන්තරව ගමන් කළ යුතු ය. කඳවුරු තුළ කාන්තාවන්ගේ ආරක්ෂාව පිළිබඳ උත්සුකතාවන් – කායිකව හා මානසිකව – ද කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කළ යුතු ය. මීට අමතරව, අභ්‍යන්තර ගැටුමේ බලපෑමට ලක් වූ හා සුනාමියෙන් දිවි ගලවා ගත් කාන්තාවෝ ද තම පෞද්ගලික/ප්‍රාදේශීය ජීවන වටපිටාවේ දී අවදානමට ලක් වී සිටිති. මේ ගැටලු ආමන්ත්‍රණය නො කළ හොත්, මානව සුරක්ෂිත භාවයෙහි හා කාන්තාවන්ගේ මානව අයිතීන්හි ලා අත් විය හැකි ප්‍රතිවිපාක විනාශකාරී විය හැකි ය, සහ/හෝ එම ප්‍රතිවිපාක මගින් බරපතල නීති උල්ලංඝනයන් ඇති විය හැකි ය.

අවතැන් වූ ජනයා වෙසෙන කඳවුරු හා තාවකාලික නිවාසවල දිවි ගෙවන කාන්තාවන් සම්බන්ධයෙන් ගත් කළ ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා ස්ත්‍රීන්ට විශේෂ වූ සෞඛ්‍යමය ගැටලු වැඩි වී ඇත. ස්වාමි පුරුෂයන්, පවුලේ පිරිමි සාමාජිකයන් හා හමුදා කාර්ය මණ්ඩලය විසින් සිදු කෙරෙන තර්ජනයන් හා දූෂණය හා අඩන්තේට්ටම් වැනි ලිංගික හිංසනයේ, කායික – හා මානසික – අපයෝජනයේ අවදානම දැඩි ලෙස ඉහළ නංවන බැවින්, කඳවුරු තුළ හමුදාව රැඳී සිටීම හා කඳවුරු තුළ සිටින අවතැන් වූ පුරුෂයන් මත්පැන් පරිභෝජනය කිරීම කාන්තාවන්ගේ ජීවිත කෙරෙහි ඉතා ගැඹුරින් බලපායි. ඵලදායී වැඩ කටයුතුවල යෙදීමේ හා අවතැන් වූවන් සඳහා වන කඳවුරු තුළ තම හුරුපුරුදු ප්‍රජා/කුටුම්බ කාර්ය භාරයන්හි යෙදීමේ ලා පිරිමින්ට වන අවස්ථාවන් නැති වී යාම සමග වැඩි වන මත්පැන් (දුෂ්)භාවිතය නිරන්තරව බැඳී පවතී. ආරක්ෂක පියවරයන් හරහා කාන්තාවන් ආරක්ෂා කිරීම, කාන්තාවන්ගේ අදහස් පළ කිරීම සඳහා සංවාද මණ්ඩප පිහිටුවීම සහ සුරක්ෂිත වාතාවරණයක් තුළ සිය උත්සුකතාවන් ප්‍රකට කිරීම, එමෙන් ම කාන්තාවන් හා පුරුෂයන් කඳවුරු තුළ/පිටත සප්‍රයෝජනවත් හා තෘප්තිදායක ක්‍රියාකාරකම්වල යෙදවීම වැනි නිවාරණ යාන්ත්‍රණයන් පිහිටුවීම යන දෙකට ම සුදුසු ක්‍රියා මාර්ග ගත යුතු ය.

**6** වන මූලධර්මය: දේශීය හැකියාධාරිතාවන් මත ම ව්‍යසන ප්‍රතිචාර පදනම් කිරීමට අප වැයම් කල යුතු ය. සියලු මහජනතාව හා ප්‍රජාවන් – ව්‍යසන අවස්ථාවක දී පවා – පීඩාවට පත් විය හැකි තත්ත්වයන් සේ ම හැකියාධාරිතාවන් ද අත්පත් කර ගනිති. හැකි සෑම තැනක දී ම දේශීය කාර්ය මණ්ඩලයේ සේවය ලබා ගැනීමෙන්, දේශීය අමුද්‍රව්‍ය මිල දී ගැනීමෙන් හා දේශීය සමාගම් සමග ගනුදෙනු කිරීමෙන් අපි මෙම හැකියාධාරිතාවන් ශක්ති සම්පන්න කරන්නෙමු. හැකි සෑම තැනක දී ම දේශීය රාජ්‍ය නොවන මානව සුභසාධන ආයතන කොටස්කරුවන් ලෙස සලකා ඔවුන් මගින් කටයුතු කරන්නෙමු. අදාළ තන්හි දී දේශීය පරිපාලන ව්‍යුහයන් සමග සහයෝගී වන්නෙමු. අපගේ හදිසි අවස්ථා ප්‍රතිචාරයන්හි දී විධිමත් සම්බන්ධීකරණ කටයුතුවලට අපි ඉහළ ප්‍රමුඛත්වයක් දෙන්නෙමු. සහනාධාර ක්‍රියාකාරකම්වලට ඉතා සෘජු ලෙස සම්බන්ධ වන්නන් තමන් ක්‍රියා කිරීමට උත්සුක වන රටවල් තුළ කළ යුතු හොඳ ම ක්‍රියාව මෙය වන අතර ඒ සඳහා එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයේ අදාළ නියෝජිතයන් ද ඇතුළත් කර ගත යුතු ය.

හය වන මූලධර්මය තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වනුයේ සම්බන්ධීකරණයට ප්‍රමුඛත්වය හා තිරසර දේශීය හැකියාධාරිතාවන් ගොඩ නැංවීම ප්‍රවර්ධනය යි.

- දේශීය හැකියාධාරිතාවන් මත පදනම් වන්න
- දේශීය කාර්ය මණ්ඩල සේවයෙහි යොදවන්න
- දේශීය අමුද්‍රව්‍ය මිල දී ගන්න, දේශීය සමාගම් සමග ගනුදෙනු කරන්න
- දේශීය රාජ්‍ය නොවන සංවිධාන කොටස්කරුවන් ලෙස සලකා ඔවුන් මගින් වැඩ කිරීම
- අදාළ තන්හි දී දේශීය පරිපාලන ව්‍යුහයන් සමග සහයෝගී වන්න
- සම්බන්ධීකරණයේ දී එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයේ අදාළ නියෝජිතයන් ඇතුළත් කල යුතු ය

ශ්‍රී ලංකාව තුළත් ශ්‍රී ලංකාව හා එහි ජාත්‍යන්තර සහකරුවන් අතරත් නව ආතතීන්හි අවදානම අවම කිරීම මගින්, සාමය හා සංවර්ධනය සඳහා වූ නව අවස්ථාවන්හි සම්පූර්ණ වාසිය ලබා ගන්නා සහසම්බන්ධී ආකාරයකින් ද දිගු කාලීන තිරසර හැකියාධාරිතාවන් ගොඩ නැගීමට සහාය දීම අරමුණු කරන රාමුසැකැස්මක් තුළ ද ශ්‍රී ලංකාවෙහි පුනරුත්ථාපන හා සංවර්ධන ප්‍රයත්නයන් සැලසුම් කිරීම හය වන IFRC/ICRC මූලධර්මයෙන් ඉල්ලා සිටී.

පීඩාවට පත් කාන්තාවන් හා පුරුෂයන්ගේ ද ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ඇතුළු දේශීය රාජ්‍ය නොවන සංවිධානයන්ගේ ද හැකියාධාරිතාවන් ගොඩ නැගීමටත් ඔවුන් සහ ඒවා බල ගැන්වීමටත් අදාළ ප්‍රදේශවල සිටින ජාතීන් අතර සහජීවනය ප්‍රවර්ධනය කිරීමටත්, එහි ලා උපකාරී වන අයුරින් සිවිල් සමාජය නියෝජනය කරන කොටස්කරුවන් හා පරිපාලන ව්‍යුහයන් අතර ප්‍රතිපත්තිමය සංවාදය හා ක්‍රමෝපායාත්මක සන්ධානයන් ශක්තිමත් කිරීමටත් මානව සුභසාධන මැදිහත් වීම් මගින් පරිශ්‍රම දැරිය යුතු ය.

දිවයින පුරා ද ප්‍රාදේශීයව ද යනාදි වශයෙන් මැදිහත් වීමේ පරිමාණය පිළිබඳව ඉක්මන් එකඟතාවකට ළඟා විය යුතු ය යි ඉල්ලීමක් ද එක් එක් රාජ්‍ය නොවන සංවිධානයේ සංසන්දනාත්මක වාසි සහගත තත්ත්වයන්, විශේෂඥතාව සහිත ක්ෂේත්‍රයන් හා පූර්ව අත්දැකීම් මත පදනම් වී ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීමේ අවශ්‍යතාවක් ද පවතී. දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන අතර, නියෝජනාත්මක කොටස්කරුවන් අතර, හා ආධාර දෙන ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය නියෝජ්‍යායතන අතර සම්බන්ධීකරණය ක්‍රියාවට නැඹුරු වූවක් විය යුතු වන අතර භර කරුණු හා අවශ්‍යතාවන් ප්‍රායෝගිකව ආමන්ත්‍රණය කිරීම පිළිබඳව එකඟතාවකට ආ යුතු ය.

කඩිනමින් ආධාර සැපයීමට ඉදිරිපත් වීම මගින් වත් ප්‍රකෘතිකරණ ක්‍රියාවලිය තුළ යම් සුවිශේෂ සංවිධානයක සහ/හෝ රටක ස්ථාවරය රැක ගැනීමට වත් ගුණාත්මක භාවය පිළිබඳ ප්‍රමිතීන් සම්මුති ගැස්විය නොහැකි ය. එක ම ප්‍රයත්නයෙහි දෙවරක් යෙදීමෙන් වත් විශේෂිත අංශයන් තුළ නොගැළපෙන ලෙස එකිනෙක මත පතිත වීමෙන් වත් මානව සුභසාධන අරමුදල් හා මූල පිරිම් අපතේ නොයන බව රාජ්‍ය නොවන සංවිධාන විසින් තහවුරු කළ යුතු ය. අනවධානය නිසා, යොදා ගැනීම සඳහා දැනට පවතින මානව සුභසාධන අරමුදල් සහ විශේෂඥතාවන්ගේ පරිමාව (දේශීය හා ජාත්‍යන්තර) රට තුළ සාමය හා තිරසර භාවය අනතුරේ හෙළන ව්‍යාපෘති සඳහා වැරදි ලෙස වැය කිරීමේ හෝ දුෂ්භාවිතයේ අවදානමට ලක් විය හැකි අතර තවත් මානව ව්‍යසනයකට ඇද වැටීමේ අවදානම ඇති කරයි.

රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා සංවිධාන, ප්‍රජා-පාදක සංවිධාන, දේශීය පෞද්ගලික අංශය, පරිපාලන ව්‍යුහයන්, ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ආධාර දෙන්නන් සමග හා ඔවුන් අතර මත් සප්‍රයෝජනවත් හවුල්කාරකම් පත්තර ගැන්වීම මගින් විශේෂඥ මානව සුභසාධන ප්‍රයත්නයන් රටෙහි දිගු කාලීන මහජන-කේන්ද්‍රීය සංවර්ධනය සඳහා සහාය විය යුතු ය. මානව සුභසාධන ආධාර හා සංවර්ධනය සම්බන්ධයෙන් ගත් කල එක්සත් ජාතීන් (UN) ඉටු කරන දැවැන්ත භූමිකාව කෙරෙහි විශේෂ අවධාරණය දිය යුතු ය. කෙසේ වුව දේශීය හා ජාත්‍යන්තර ක්‍රියාකාරකයන්

අතර හවුල්කාරකම් තුළ වන අරමුදල්මය සබඳතාවන්හි සැබෑ ස්වභාවයන් පිළිබඳව රාජ්‍ය නොවන සංවිධාන පරීක්ෂාවට ලක් වේ.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාත්මකව වැඩි වීම මගින් හා ඔවුන් පරිපාලනය කරන අරමුදල් මගින් රාජ්‍ය නොවන සංවිධාන අංශයේ කාර්ය භාරය හා එහි බලපෑම සැලකිය යුතු ලෙස පුළුල් වීමක් ඇඟවුම් කෙරෙයි. රාජ්‍ය නොවන සංවිධාන අංශයේ (දේශීය හා ජාත්‍යන්තර) වැඩීම කවර ප්‍රමාණයක් දක්වා සිදු වේ ද යන්න හා නව ක්‍රියාකාරකයන්ගේ සැලකිය යුතු සංඛ්‍යාත්මක වැඩි වීමක් ස්වයං-පෝෂිත භාවය හා තිරසර සංවර්ධනය පෝෂණය කරන්නේ ද නැත හොත් බාහිර මූල්‍ය හා මානව සම්පත් මත විශ්වාසය තැබීමක කොන්දේසි තුළ රඳා පවත්නා සංස්කෘතියක් බිහි වේ ද යන්න ප්‍රධාන උත්සුකතාවක් ලෙස පවතියි.

සංවිධානයේ ප්‍රධානයා විසින් සංකේතාත්මකව නියෝජනය කෙරෙන බොහෝ දේශීය රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජාව තුළ, ගම තුළ හා අසල්වැසි ප්‍රදේශ තුළ වන අනෙකුත් දේශීය රාජ්‍ය නොවන සංවිධානවලින් හුදෙකලාව නිරන්තරව ක්‍රියාත්මක වන අතරේ අරමුදල් හා ජාලගත වීම අරබයා ජාත්‍යන්තර ප්‍රජාවන් වෙත සේන්දු වෙති. එම නිසා දේශීය හා ප්‍රාදේශීය ක්‍රියාකාරකයන් අතර අන්තර්-ක්‍රියාකාරීත්වය හා ජාලගත වීම ඇති කිරීමක් කොහෙත් ම නොපවතින තරම් ය.

එම නිසා දේශීය රාජ්‍ය නොවන සංවිධාන තමන් ප්‍රත්‍යක්ෂ කර ගත් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල න්‍යාය පත්‍රයන්ට ප්‍රතිචාර දක්වන, කෙටි කාලීන බාහිර අරමුදල්කරණය මත රඳා පවතින, ආධාර දෙන්නන්ගේ වෙනස් වන කැමැත්තට හා අරමුදල්කරණයේ කොන්දේසි සහගත භාවයට යටත් වන තත්ත්වයක් පැන නගියි. එය දැනට මත් බිඳෙනසුලු තත්ත්වයකට පත්ව ඇති ශ්‍රී ලංකාවෙහි දේශීය රාජ්‍ය නොවන සංවිධාන අංශය තීව්‍ර විවේචනයකට ලක් විය හැකි ප්‍රතිඵල ජනනය කරයි.

දේශීය හවුල්කරුවන් හඳුනා ගැනීම තුළින් කාන්තාවන්, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය, ජනවාර්ගිකත්වය හා ආගම සම්බන්ධ වන ප්‍රශ්න වැනි ආධාර ලබා දෙන ක්ෂේත්‍රවල පවතින විවිධ වූ උත්සුකතාවන් නියෝජනය වීම තහවුරු කිරීම වැදගත් වේ.

රට තුළ පහසුකම්කරණයේ හා බල ගැන්වීමේ මුඛ්‍ය කාර්ය භාරයක් ඉටු කිරීමට, ප්‍රජාවන් තුළ හා ප්‍රජාවන් අතර කාන්තාවන්ගේ හා පුරුෂයන්ගේ, (අනෙකුත්) දේශීය රාජ්‍ය නොවන සංවිධානයන්ගේ, දේශීය පෞද්ගලික අංශයේ හා කොටස්කරුවන්ගේ උත්සුකතාවන්ට හා අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීමට: සහ පෙර

නොවූ විරූ බාහිර ආධාර අරමුදල් පරිමාවන් හා වැඩි වන ව්‍යාපෘති ක්‍රියාකාරකම් උකහා ගැනීමට ඇතැම් විට ප්‍රමාණවත් නොවන කළමනාකරණ ශක්‍යතා සහිත දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට වගකීම් සහගත අරමුදල් සැපයීම සහතික කිරීමට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල හා විශාල දේශීය රාජ්‍ය නොවන සංවිධානවල තාක්ෂණික කාර්ය මණ්ඩලය ප්‍රබල ලෙස උනන්දු කරනු ලැබේ.

නියමිත කටයුත්තේ සෑම මට්ටමක දී ම දේශීය හැකියාධාරිතාවන් ගොඩ නැගීම පහසුකම්කරණය කිරීමේ භූමිකාවේ දී රාජ්‍ය නොවන සංවිධානය ව්‍යාපෘති චක්‍රයෙන් පිටත පිහිටා සිටිය යුතු අතර, විවිධ අවධීන් සඳහා සැලසුම් සංයුක්ත කිරීම, හා සම්පත් බලමුළු ගැන්වීමට සහ අරමුදල් සැපයීම විවිධාංගීකරණයට සහාය දීම කළ යුතු ය. රාජ්‍ය නොවන සංවිධානවලට අරමුදල් ලබා ගත හැකි අංශ තුනක් වෙයිඃ එනම් පෞද්ගලික අංශය, පරිපාලන ව්‍යුහයන්/රාජ්‍ය අංශය හා පොදු මහජනතාව යි.

දේශීය වෙළඳ පොළ ගතිකයන්/පෞද්ගලික අංශය කෙරෙහි ව්‍යසනයේ බලපෑම, සහ පීඩාවට පත් වූ හා අවතැන් වූ මහජනතාව කෙරෙහි සහ දිවයින පුරා දුප්පත් ප්‍රජාවන් කෙරෙහි එහි පුළුල් ඇඟවුම් සැලකිල්ලට ගැනීම ද වැදගත් වේ. සහනාධාර නියෝජ්‍යායතනවල දැවැන්ත ආහාර බෙදා දීමේ ප්‍රයත්නයන් හේතුවෙන් සහල්, මාශ බෝග හා පාන් වැනි ප්‍රධාන ආහාරවල වෙළඳ පොළ මිල ගණන් වැඩි විය. භෞතික යටිතල පහසුකම් ගොඩ නැංවීමේ ලා යොදා ගන්නා අමුද්‍රව්‍යවල මිල ගණන් ද ඉහළ ගියේ ය. මාලු මිල, විශේෂයෙන් මුහුදු මාලුවල මිල, විනාශයෙන් කෙළෙසීම හා මුහුදට ජීවිත බිලි වීම පිළිබඳ දේශීය සැලකිලිමත් වීම් කරණ කොට ගෙන සුනාමියෙන් ක්ෂණික ඉක්බිත්තෙහි පැහැදිලි ලෙස ම පහත වැටුණි. ප්‍රතිඵලයක් ලෙස රට තුළ ක්‍රියාකාරී ධීවර ප්‍රජාවන්ගේ ජීවිකා වෘත්තීන් පීඩාකාරී බලපෑමකට ලක් විය.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය කෙරෙහි සුනාමියේ බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක හෝ සංඛ්‍යා ලේඛනමය තොරතුරු ඇත්තේ සුළු වශයෙනි, නැත් නම් ඇත්තේ ම නැත. අවශේෂ කණ්ඩායම් දිගු කාලීන ආහාර අනාරක්ෂිතතාවට මුහුණ දෙන්නේ ද නැති නම් දේශීය වෙළඳ පොළවල් විකෘත කිරීමක් සිදු වී තිබේ ද යන්න නිශ්චය කිරීම සඳහා ආහාර පැවතීම හා වෙළඳ පොළ මිල නිරීක්ෂණය කිරීම භාවිතයට ගත යුතු ය.

දේශීය සැපයුම සහිත නිපුණතා ඉල්ලුම් සැලකිල්ලට ගන්නා, හා දේශීය ශ්‍රම වෙළඳ පොළ ප්‍රවණතාවන්ට ප්‍රතිචාර දක්වන සහ ආණ්ඩුවේ කම්කරු නීති හා එකඟ වන, දේශීය කාර්ය මණ්ඩලය කුලියට ගන්නා වැටුප් ව්‍යුහයන් හා කොන්දේසි පිළිබඳ ප්‍රශ්නයේ දී රාජ්‍ය නොවන සංවිධාන විසින් සමාන අවස්ථාවන් හා ස්ත්‍රී-පුරුෂ සමානතාව ප්‍රවර්ධනය කරන ප්‍රමිතීන් වර්ධනය කිරීමත් ඒවාට ඇලීබැඳී ගැනීමත් කළ

යුතු ය. මෙමගින්, සමස්තයක් ලෙස රට තුළ දේශීය රාජ්‍ය නොවන සංවිධාන අංශයේ තිරසර භාවය හා සඵලදායී ආධාර කටයුතු කෙරෙහි ඇතැම් විට දුබල කරවන ප්‍රතිඵලයක් ජනනය කරනු ඇති, මුඛ්‍ය දේශීය කාර්ය මණ්ඩලය දේශීය රාජ්‍ය නොවන සංවිධානවලට පිටස්තරව කුලියට ගැනීමත් හා කෙටි කාලීන පදනමක් මත ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන තුළට උරා ගැනීමත් අධෛර්යමත් කෙරෙනු ඇත.

විශේෂයෙන් ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන දේශීය හවුල්කරුවන්ගේ දැනුම හා විශේෂඥතාවන් ප්‍රයෝජනයට ගැනීමේ නිර්මාණාත්මක මංමාවත් විමසා බැලිය යුතු ය. එමෙන් ම දේශීය කාර්ය මණ්ඩලය බවට පත් වී සිටින්නන්ට අවශ්‍ය තත්හි දී විශ්ලේෂණමය හා ප්‍රායෝගික නිපුණතාවන්, සමථකරණයන් හා පුනරුත්ථාපනය, සාමය හා ගැටුම් විශ්ලේෂණය, වාසස්ථාන, සෞඛ්‍යය, ස්ත්‍රී-පුරුෂ සමානතාව හා කෘෂිකර්මය වැනි මානව සුභසාධන හා සංවර්ධනමය ප්‍රශ්න පිළිබඳ පුහුණුව ඇතුළත් පුහුණු කිරීම ප්‍රදානය කළ යුතු ය. සම්බන්ධිත සියලු පාර්ශ්වයන් විසින් හවුල්කාරකම් ක්‍රියාවලීන් පිළිබඳව කෙරෙන තක්සේරුවක් මගින්, එක්ව ඉගෙනීමටත් දේශීය හා ජාත්‍යන්තර සහයෝගිතාව හා යහපරිචයන් තුළින් ඉගෙනීමටත් රාජ්‍ය නොවන සංවිධාන සඳහා නව රූපාකාරයන් හා විධික්‍රම ඇති කිරීම පහසුකම්කරණය කෙරෙනු ඇත.

එමෙන් ම, නිපුණ දේශීය සේවකයන් අත හැරී යාමේ හානිකර බලපෑම් අඩු කිරීම හා ශ්‍රී ලංකාව තුළ තිරසර, ස්වාධීන, ගතික හා උද්දීප්ත දේශීය රාජ්‍ය නොවන සංවිධාන අංශයක් සඳහා ශක්තිය සපයන කොන්දේසි උසස් කර ලීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන දේශීය මානව සම්පත්වල සංවර්ධනය ශක්තිමත් කරන ක්‍රමෝපායයන් වර්ධනය කළ යුතු ය.

**7 වන මූලධර්මය:** වැඩසටහන්වල ප්‍රතිලාභීන් සහනාධාර කළමනාකරණයට සම්බන්ධ කර ගැනීම සඳහා මාර්ග සොයා බැලිය යුතු ය. ව්‍යසන ප්‍රතිචාර ආධාර ඒවායේ ප්‍රතිලාභීන් මත කිසි විටක බලයෙන් නො පැටවිය යුතු ය. සඵලදායී සහනාධාර සැපයීම හා ස්ථිර පුනරුත්ථාපනය හොඳින් ම අත්පත් කර ගත හැක්කේ ආධාර වැඩසටහන සැලසුම් කිරීම, කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීම තුළ ඒවා බලාපොරොත්තු වන ප්‍රතිලාභීන් සම්බන්ධ කර ගත් තැන දී ය. අපගේ සහනාධාර හා පුනරුත්ථාපන වැඩසටහන් තුළ සම්පූර්ණ ප්‍රජා සහභාගිත්වය අත්පත් කර ගැනීමට අපි පරිශ්‍රම දරන්නෙමු.

හත් වන මූලධර්මය තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වන්නේ දේශීයයන්ගේ උපදෙස් ලබා ගැනීම හා සහභාගිත්වය යි.

- මානව සුභසාධන ආධාර සැලසුම් කිරීම, කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීම තුළ දේශීයයන්ගේ උපදෙස් ලබා ගැනීම
- අවශ්‍යතාවː කිසි විටක ආධාර බලයෙන් නොපැටවීම

හත් වන IFRC/ICRC මූලධර්මයෙන් ඉල්ලා සිටින්නේ මධ්‍ය කාලීන හා දිගු කාලීන පුනරුත්ථාපන හා සංවර්ධන ප්‍රයත්නයන් සැලසුම් කිරීමේ ක්‍රියාවලියේ දී විවිධ ප්‍රජාවන්ට අයත් පීඩාවට පත් ස්ත්‍රීන් හා පුරුෂයන් සම්බන්ධ කර ගැනීම යි. මානව සුභසාධන සහාය සැපයීමට හා බෙදා හැරීමට ඇති හදිසි භාවය මගින්, පීඩාපත් හා අවතැන් වූ ස්ත්‍රීන් හා පුරුෂයන්, ඔවුන් ජීවත් වන ප්‍රජාවන්, නො වේ නම් ඡන්දයෙන් තෝරා පත් කර ගත් පරිපාලන ව්‍යුහයන්ගේ සහභාගිත්වයට අකුල් නො හෙළිය යුතු ය.

සහභාගිත්වය මගින් ඉල්ලා සිටින්නේ දේශීය ප්‍රජාවන්, විශේෂයෙන් ඍජුව පීඩාවට පත් ජනතාව ආධාර කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම තුළ සම්බන්ධ කර ගැනීම සම්පූර්ණයෙන් පිළිගත් එම විධික්‍රමයන් ය. එනිසා ව්‍යසනයට පෙර, ව්‍යසනය තුළ හා ව්‍යසනයට පසු ස්ත්‍රීන් හා පුරුෂයන් ලත් අත්දැකීම් ප්‍රලේඛනය හා විශ්ලේෂණය මානව සුභසාධන මූලාරම්භකත්වයන්හි ලා කේන්ද්‍රීය වේ. ප්‍රයත්නයන් සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ස්ත්‍රීන්, පුරුෂයන් හා ප්‍රජාවන් මුළුමනින් ම විමසිය යුතු වන අතර තිරසර හා සාමකාමී සංවර්ධනය කෙරෙහි ආධාර මැදිහත් වීම්වල පුළුල් බලපෑම සැලකිල්ලට ගත යුතු ය.

ව්‍යසනයේ බලපෑමට ලක් වූ හා අවතැන් වූ ප්‍රජාවන්ට සහාය හා ආධාර සැපයීම – නිරන්තරව සංකීර්ණ වන – බිම් මට්ටමේ තත්ත්වය (අවතැන් වූ ජනයා හා ඔවුන්ගේ සත්කාරක ප්‍රජාව යන දෙපාර්ශ්වයේ ම වාර්ගික-දේශපාලනික හා සංස්කෘතිකමය පැතිකඩ) පිළිබඳ අවබෝධයක් තුළ හා දිවයිනේ අභ්‍යන්තර ගැටුමෙහි පුළුල් සන්දර්භය තුළ මුල් බැස්විය යුතු ය. අවතැන් වූ හා සුනාමියෙන් පීඩිත මහජනතාවන් හසුරුවන ආකාරය මගින් සත්කාරක ප්‍රජාව හා අලුතින් පැමිණියවුන් අතර සබඳතා කෙරෙහි අතිමහත් බලපෑමක් ඇති කළ හැකි යː විවිධත්වය පැවතීම සාධනීය ලෙස හෝ ගැටුම වැඩි යන ලෙස යොදා ගත හැකි ය.

ව්‍යසනයෙන් පීඩාවට පත් ස්ත්‍රීන්, පුරුෂයන්, තරුණයන් හා ළමුන්ගේ සහභාගිත්වය ඕනෑ ම මුල පිරිමක කේන්ද්‍රයෙහි පිහිටුවන මානව සුභසාධන සහාය සැපයීම සැලසුම් කිරීමෙහි, කළමනාකරණයෙහි හා ක්‍රියාත්මක කිරීමෙහි ලා – සියලු

මට්ටම්වල දී - පැහැදිලි හා උපදෙස් ලබා ගැනීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවක් පවතී. ප්‍රජාවන්ගෙන් හා රාජ්‍ය නොවන සංවිධානවලින් ක්‍රමානුකූලව උපදෙස් ලබා ගැනීම මගින්, ජීවිත සහ ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම කරා වන එකිනෙකා කෙරෙහි වෙනස්කම් නොකරන වාතාවරණයක් ශක්තිමත් කළ හැකි ය.

අත්දැකීම් බෙදාහදා ගැනීම පහසුකම්කරණය කිරීම පිණිස දේශීය රාජ්‍ය නොවන සංවිධාන, කාන්තා කණ්ඩායම්/සංවිධාන, ආණ්ඩුවේ නිලධාරීන්, ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ආධාර දෙන්නන්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා අවශේෂ කොටස්කරුවන් සම්බන්ධ කර ගත් බහුසංස්කෘතික සංවාදයක් සංවිධානය කළ යුතු ය. දැනට මත් ප්‍රකම්පනයට පත්ව සිටින මහජනතාව මත මානව සුභසාධන මැදිහත් වීම් බලයෙන් පැටවීමට වඩා සියලු දේශීය ක්‍රියාකාරකයන් හා කොටස්කරුවන් බල ගැන්වීමේ අරමුණකින් යුතු සහභාගිත්ව ප්‍රවේශයන්ට මුල පිරීම් සම්බන්ධ කළ යුතු ය.

දේශපාලන පක්ෂවල, දේශීය රාජ්‍ය නොවන සංවිධානවල හා කාන්තා කණ්ඩායම්වල, පෞද්ගලික අංශයේ හා ජාත්‍යන්තර ප්‍රජාවෙන් පැමිණි හවුල්කරුවන්ගේ - එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යායතනවලට විශේෂ අවධානය යෙදිය යුතු ය - පරිපූර්ණ සහභාගිත්වය සඳහා ඉඩ සලසන සවිස්තරාත්මක උපදෙස් ලබා ගැනීම තුලින් හා ආණ්ඩුව විසින් ස්ථාපනය කෙරෙන පුළුල් රාමුසැකැස්මක් තුළ දේශීය මුල පිරීම්වලට සහාය දැක්විය යුතු ය.

මානව සුභසාධන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමෙහි ලාත් පුනරුත්ථාපන හා යළි ගොඩ නැගීමේ කටයුතු සැලසුම් කිරීමෙහි ලාත් වන සහයෝගිතාව මගින් ප්‍රජාවන් තුළ හා ප්‍රජාවන් අතර අන්තර්-ක්‍රියාකාරිත්වය සඳහා නව අවකාශයන් විවෘත කෙරෙන අතර එය ශ්‍රී ලංකාව තුළ සාමකාමී සහ තිරසර සංවර්ධනය වෙත එල්ල කළ යුතු ය.

8 වන මූලධර්මය: මූලික අවශ්‍යතා සපුරා ලන අතර ම සහනාධාර මගින් අනාගත ව්‍යසනයකින් ඇති විය හැකි පීඩාකාරී තත්ත්වයන් යටපත් කිරීමට ද මහත් පරිශ්‍රම දැරිය යුතු ය. සියලු සහනාධාර ක්‍රියාකාරකම් ධනාත්මක හෝ ඍණාත්මක ආකාරයකින් දිගු කාලීන සංවර්ධනය සඳහා වන ඉදිරි අපේක්ෂාවන්ට බලපෑම් කරයි. මෙය හඳුනා ගනිමින්, අනාගත ව්‍යසනයන්ගෙන් ප්‍රතිලාභීන්ට ඇති විය හැකි පීඩාකාරී තත්ත්වයන් ක්‍රියාශීලීව පහත හෙළන සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හා තිරසර ජීවන රටාවක් නිර්මාණය කර ගැනීම සඳහා උපකාර වීමට අපි පරිශ්‍රම දරන්නේමු. සහන වැඩසටහන්වල සැලසුම්කරණයේ දී හා කළමනාකරණයේ දී පාරිසරික උත්සුකතාවන් කෙරෙහි අපි සුවිශේෂ අවධානය යොමු කරන්නෙමු. ප්‍රතිලාභීන් බාහිර

ආධාර මත දිගු කාලීනව රඳා පැවතීම මග හැරීමට උත්සාහ කිරීමෙන් මානව සුහසාධන සහාය මගින් ඇති විය හැකි සෘණාත්මක බලපෑම් අවම කිරීමට ද අපි බලවත් වෑයමක් දරන්නෙමු.

අට වන මූලධර්මය තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වන්නේ දිගු කාලීන සංවර්ධන අභිමතාර්ථයන් ය.

- අනාගත පීඩාවට පත් විය හැකි තත්ත්වයන් අඩු කිරීම
- තිරසර ජීවන රටාවන්/ජීවනෝපායයන්
- පාරිසරික උත්සුකතාවන්
- බාහිර ආධාර මත දිගු කාලීනව රඳා පැවැත්ම මග හැරීම

අට වන IFRC/ICRC මූලධර්මය ඉල්ලා සිටින්නේ ආධාර මගින් මූලික අවශ්‍යතාවන් සපුරා ලීම සමග ම පීඩාපත් ප්‍රජාවන්ගේ අනාගත පීඩාවට පත් විය හැකි තත්ත්වයන් අඩු කිරීම යි. ශ්‍රී ලංකාව තුළ මැදිහත් වීම් මගින්, වඩා වේගවත් හා සමාන වැඩීම තුළින් දරිද්‍රතාව අඩු කිරීමට වඩාත් හොඳ පාරිසරික තිරසර භාවයකට ඉඩ සලසන හා සමස්ත දේශීය පරිපාලනය ප්‍රවර්ධනය කරන සංවර්ධනය සඳහා සුදුසු හා නව ප්‍රවිෂ්ටයන් විමසා බැලීම අවශ්‍ය ය.

එසේ කිරීමෙන්, ව්‍යසනයෙන් දිවි ගලවා ගත් ස්ත්‍රීන් හා පුරුෂයන් සියල්ල ඉවසා දරා සිටින අක්‍රිය ගොදුරු නොවන අතර ව්‍යසනය(න්)ට ප්‍රතිචාර දැක්වීමේ දී හා ජීවනෝපායයන් යළි ගොඩ නැගීමේ දී සප්‍රාණික කාර්ය භාරයක් ඉටු කරන(කළ) බව හඳුනා ගැනීම වැදගත් වේ. ව්‍යසන(වලින්)යෙන් දිවි ගලවා ගත් කාන්තාවන්, පුරුෂයන්, තරුණයන්, ගැහැණු හා පිරිමි ළමුන් වැනි දේශීය කොටස්කරුවන් විසින් ඉල්ලා සිටින ලද අවශ්‍යතාවන්ට සම්පත් මගින් ප්‍රතිචාර දැක්වෙති යි යන්න තහවුරු වන ආකාරයෙන් සම්පත් වඩා ඵලදායී හා කාර්යක්ෂම භාවිතයෙහි යෙදීමේ තදබල අවශ්‍යතාවක් පවතී.

යළි ගොඩ නැගීම හා තම ජීවනෝපායයන් සහ නිවාස වැඩි දියුණු කර ගැනීම පහසුකම්කරණය කරමින්, කාන්තා-මූලික කුටුම්බයන් හා ගැහැණු ළමුන් කෙරෙහි යොමු කරන්නා වූ අවධානයකින් යුතුව, ඍජුව පීඩාවට පත් වූ හා අවතැන් වූ මහජනයා අතර සිටින වඩාත් ම පීඩාවට පත් විය හැකි සමාජ කණ්ඩායම්වල හැකියාධාරිතාවන් ශක්ති සම්පන්න කිරීමටත් ඒවාට සහාය දැක්වීමටත් මුල පිරීම් ඉලක්ක කළ යුතු ය: එය කළ යුත්තේ සමස්ත සාමූහික දැක්මක් පවත්වා ගන්නා

අතරතුර තමන්ගේ ම අවශ්‍යතාවන් නිශ්චය කර ගැනීමට පීඩාවට පත් විය හැකි කණ්ඩායම්වලට ඉඩප්‍රස්තාව නිර්මාණය කර දීමෙනි.

එසේ කිරීමේ දී, සුවිශේෂ ගැටුම්කාරී පාර්ශ්වයක් සමග සම්පාත වන ඕනෑ ම සහාය සැපයීමක පවත්නා අන්තරාය හඳුනා ගැනීම අවශ්‍ය වන අතර අභ්‍යන්තර ගැටුමට සම්බන්ධ යම් සුවිශේෂ කණ්ඩායමක් ශක්තිමත් කිරීම සඳහා පැහැදිලි/නිසැක සහායක් ලබා දුන්නේ ය යන්න වැනි එක් සුවිශේෂ ජනවාර්ගික, ආගම්-පාදක හෝ දේශපාලන කණ්ඩායමකට සහාය දුන්නේ යැයි පවතින සහජ දේශීය හැඟීම් පිළිබඳව රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් වීම අවශ්‍ය ය. කිසි යම් විශේෂිත කණ්ඩායමක් තනි කොට ගෙන සහාය ප්‍රදානය කරන (ප්‍රදානය කරනවා සේ පෙනෙන) මුල පිරීම් මගින් ස්වල්ප දෙනෙකුට කෙටි කාලීන සහනයක් සැපයෙනු ඇති නමුදු ප්‍රාදේශීය කොටස්කරුවන් - ඍජුව හෝ සමස්තයක් ලෙස/ප්‍රාදේශීයව හෝ දිවයින පුරා - මානව ආරක්ෂාව සම්බන්ධ දිගු කාලීන පීඩාකාරී තත්ත්වයන්ට නිරාවරණය කරයි. එනිසා ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ උත්සුකතාවන්, ජනවර්ගය, කුලය හා ආගම යාන්ත්‍රණයන්ට ඇතුළු වන බව සියලු මුල පිරීම් විසින් සහතික කළ යුතු ය: එමෙන් ම සියලු මුල පිරීම් විසින් ශ්‍රී ලංකාව තුළ දිගු කාලීන ස්ත්‍රී-පුරුෂත්ව සංවේදී, සාමකාමී හා තිරසර සංවර්ධනයක් සහතික කළ යුතු ය යන සමස්ත ස්වරූපයේ ඉලක්කයක් සැලකිල්ලට ගත යුතු ය.

ස්ත්‍රී-පුරුෂ භූමිකාවන් හා සබඳතාවන් වෙනස් වන්නේ කෙසේ ද යන්න පිළිබඳ විධිමත් අවබෝධයකින් හා ස්ත්‍රී-පුරුෂ සමානතාව ප්‍රවර්ධනය කිරීම සමගින් පශ්චාත්-ව්‍යසන ප්‍රජාවන් තුළ තිරසර සංවර්ධනයේ හා අර්ථවත් සාමයේ ඉලක්කයට ළඟා විය හැකි ය. එම නිසා ස්ත්‍රීන් හා පුරුෂයන් සමාන ලෙස සම්බන්ධ කර ගනිමින් ව්‍යසන අවදානම් කළමනාකරණයේ හා සාමය ගොඩ නැගීමේ ඵලදායකත්වය වැඩි දියුණු කරනු පිණිස සියලු අදාළ පශ්චාත්-ව්‍යසන ප්‍රයත්නයන්හි සැලසුම්කරණ අදියරේ දී ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය විශ්ලේෂණය සහ පාරිසරික විපත් හා පීඩාකාරී තත්ත්වයන් සටහන්ගත කිරීමේ විධික්‍රම ඇතුළත් කළ යුතු වේ. ප්‍රකෘතිකරණ ක්‍රියාවලිය තුළ කාන්තා සහභාගිත්වය හා නායකත්වය සඳහා අර්ථපූර්ණ අවස්ථාවන් නිර්මාණය කිරීමට හා ඒකාග්‍ර කිරීමටත්, කාන්තා වෘත්තිකයන් (අධ්‍යාපනඥයන්, විද්‍යාඥයන්, හදිසි අවස්ථා කළමනාකාරිනීන්) හා ව්‍යසන කළමනාකරණය, සාමය, අභිදේශනය, මානව හිමිකම් හා පරිසරය ආදියට සම්බන්ධ වූ ඒවා වැනි කාන්තා ප්‍රජා සංවිධාන ඒකාබද්ධ කිරීමටත් අවධානය දිය යුතු වේ.

ධීවර ප්‍රජාවන් සම්බන්ධයෙන් ගත් කල පුරුෂාධිපත්‍යයක් සංකේතවත් කරන මසුන් ඇල්ලීම හා බැඳුණු ක්‍රියාකාරකම්වලට පමණක් අවධානය සීමා නො කළ යුතු ය. මසුන් සැකසීමේ ක්‍රියාවලිය, ගබඩා කිරීම හා විකිණීම, සහ ජලාශවල මසුන් ඇති

කිරීම, මසුන් ඇල්ලීමේ උපකරණ හා ආම්පන්න තැනීම හා නඩත්තු කිරීම මත ද ධීවර ප්‍රජාවෝ පදනම් වෙති. එබඳු ක්‍රියාකාරකම්වල කාන්තාවන්, පුරුෂයන් හා තරුණයෝ සහභාගි වෙති. එම නිසා මසුන් ඇල්ලීමෙන් හා බෝට්ටු සැපයීමෙන් ඔබ්බට යන, කාන්තාවන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන සැකසීමේ හා වානිජ්‍යමය ක්‍රියාකාරකම් ද ඇතුළත් වන, ධීවර ප්‍රජාවන්ගේ ප්‍රායෝගිකව ක්‍රියාශීලී පද්ධතියට ම සහාය ලබා දිය යුතු වේ.

එමෙන් ම වෙරළබඩ ප්‍රජාවන්හි සියලු ස්ත්‍රීන් හා පුරුෂයන් ධීවර ජනයා නොවන බව ගැන දැනුවත් වීම ද වැදගත් වේ. තිරසර ජීවනෝපායයන් පහසුකම්කරණය කිරීමේ දී කේන්ද්‍රීය උත්සුකයක් වන්නේ සමස්තයක් ලෙස රැකියා නිර්මාණය හා සේවයේ යෙදවීම යි. මේ පිළිබඳව සලකා බැලීමේ දී, ඇතැම් විට කාන්තාවන්ට නව නිපුණතාවන් පිරිනැමෙනු ඇති ඇඳුම් මැසීම හා ආහාර සැකසීම වැනි සාම්ප්‍රදායික යැයි කියනු ලබන ස්ත්‍රීන්ට ම වෙන් වූ ආදායම් උත්පාදන ව්‍යාපෘතීන්ට ළඝු කරනවාට වඩා කාන්තාවන්ට පිරිමින් සමග එක පෙළට ප්‍රකෘතිකරණ පුහුණුව හා සම්පත් වෙත ප්‍රවේශය ලැබෙන්නේ ද යන්න ගැන පරික්ෂාකාරී වීමත් එම තත්ත්වය සහතික කිරීමත් වැදගත් වේ. මෙම වර්ගවල ක්‍රියාකාරකම්, ශ්‍රම-සූක්ෂ්ම ලෙස ගුණාංගීකරණය වන, පහළ ආදායම් ලැබෙන හා වැඩි දියුණු වීමට හෝ ස්වාධීනව පැතිරී යාමට – සහ ජීවනෝපායයන් දියුණු කර ගැනීමට නිරන්තරව කුඩා අවකාශයක් සම්පාදනය කරන ඒවා ය.

පසු ගිය පස් වසර තුළ ශ්‍රී ලංකාව නියඟය, ගංවතුර හා නාය යාම් වැනි ස්වාභාවික ව්‍යසනයන්හි – ඒවා නිතර සිදු වීම, තීව්‍රතාව හා ඇති වූ විනාශය යන අංශවලින් – ඉහළ යාමේ ප්‍රවණතාවක් අත්දැක ඇත. දේශීය කොටස්කරුවන් විසින් පිළියෙළ කරන ලද පෙරසැලසුම් සමාලෝචනයට ලක් කළ යුතු ය, ගුණාත්මකව උසස් තත්ත්වයට ගෙන ආ යුතු ය, පශ්චාත්-සුනාමි සන්දර්භයට ගැළපෙන සේ සකස් කළ යුතු ය. මුල පිරිම් මගින් ව්‍යසනයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා සියලු ප්‍රජාවන්ට අයත් ස්ත්‍රීන් හා පුරුෂයන් සතු හැකියාධාරිතාව ඉහළ නැංවිය යුතු ය.

නිවාස සැපයීම පිළිබඳ කාරණයේ දී, ස්වාභාවික ව්‍යසනයන්ගෙන් එල්ල වන ඇඩි අවදානමට ස්ත්‍රීන්, පුරුෂයන් හා ඔවුන්ගේ පවුල් හා ප්‍රජාවන් නිරාවරණය නොකෙරෙනු පිණිස, ස්වාභාවික උපද්‍රව සැලකිල්ලට ගන්නා යෝග්‍ය ගොඩනැගිලි ප්‍රමිතීන් වර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මුල පිරිම් විසින් දිරිමත් කළ යුතු ය. නිවාස යළි සෑදීම ඉල්ලා සිටින ස්ත්‍රීන් හා පුරුෂයන් ද එවැනි ගොඩනැගිලි සැලසුම් කිරීමේ දී හා තැනීමේ දී සම්බන්ධ කර ගත යුතු ය, අලුතින් ගොඩ නැගූ නිවාස සඳහා ලබා දෙන ඔප්පුවල ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙපාර්ශ්වයේ ම නම් පිළිගත යුතු ය. එමෙන් ම සියලු කාන්තාවන් පුරුෂයන් සමග ජීවත් නොවන නිසා නැත හොත් සියලු

කාන්තාවන් ආර්ථිකව යැපෙන්නන් නොවන නිසා කාන්තාවන් සඳහා ඉඩම් අයිතීන් ප්‍රවර්ධනය කළ යුතු ය.

ව්‍යසන(වලින්)යෙන් පසු මාර්ග, ජලය, කානු, නිවාස හා පාසල් වැනි භෞතික යටිතල පහසුකම් ගොඩ නැගීම සමාජමය යටිතල පහසුකම් ගොඩ නැගීමේ කාරණාවන් සමග සම්බන්ධ කළ යුතු ය. සමාජමය හා භෞතිකමය යටිතල පහසුකම් පිළිබඳව අන්තර්-සම්බන්ධිත හා ඒකාබද්ධ ආකාරයකින් සලකා නො බැලුව හොත් බාහිර ආධාර මත දිගු කාලීනව රඳා පවතින තත්ත්වයක් ලෙහෙසියෙන් ඉස්මතු විය හැකි ය.

භෞතිකමය යටිතල පහසුකම් ගොඩ නැගීමේ ව්‍යාපෘතිවල දේශීයයන් සේවයේ යෙදවීමේ හැකියාව සැලකිල්ලට භාජන කළ යුතු වන අතර රට තුළ දරිද්‍රතාව අඩු කිරීමේ හා ආර්ථික සංවර්ධනයට අනුබල දීමෙහි ලා දැවැන්ත වාසි සහගත තත්ත්වයක් එයට ඇත. කෙටි කලින ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන් විසින් තෝරා ගැනෙන වියදම් සහිත, උපකරණ-මූලික වර්ගයේ විධික්‍රමවලට වඩා රැකියා-මූලික ප්‍රවේශයන් යොදා ගන්නා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ප්‍රයත්නයන්ට දිගු කාලීන තිරසර සංවර්ධනයට දායක විය හැකි ය. රැකියා-මූලික මූල පිරීම්වල යෙදී ගැනීමේ දී දේශීයව සහභාගි වන ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට සමානව සැලකීම ඇතුළු විධිමත් සේවා කොන්දේසි හා කම්කරු ප්‍රමිතීන් තහවුරු කිරීමට සියලු ක්‍රියාකාරකයන් මතක තබා ගත යුතු ය. ගොඩ නැගීමේ හා මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ප්‍රධාන උපක්‍රමය ලෙස දේශීය ශ්‍රමය යොදා ගැනීම මගින් අවතැන් වූ ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා රැකියා අවස්ථා සැපයීමටත් ඒකාබද්ධව හා සාමූහිකව ගනුදෙනු කිරීම තුළින් ප්‍රජා සංවර්ධනය ඉහළ නැංවීමටත් හැකි වේ. ශ්‍රම-පාදක මූල පිරීම් මගින් දිගු කාලීන පැවැත්ම හා තිරසර ආයෝජනය, පුනරුත්ථාපනය පිළිබඳ ගැටලු තව දුරටත් ආමන්ත්‍රණය කිරීමටත් භෞතික යටිතල පහසුකම් ඉදි කිරීමට හා නඩත්තු කිරීමට පොදු මහජනතාවගේ හා පෞද්ගලික අංශයේ හැකියාධාරිතාව ගොඩ නැංවීමටත් හැකි වේ

දේශපාලනික, ආර්ථික හා සාමාජීය සංවර්ධනය සඳහා වූ රාමුසැකැස්මක් කළමනාකරණය කිරීම සුළු කර්තව්‍යයක් නො වේ. රටේ සංවර්ධන සැලසුම(සැලසුම්) හා ශ්‍රී ලංකාව තුළ සමස්ත සංවර්ධන ක්‍රියා දාමයෙහි උත්සුකතාවන්, සහ සාමය ගොඩ නැගීම හා ස්ත්‍රී-පුරුෂ සමානතාව ප්‍රවර්ධනය කිරීම සම්පව සැලකිල්ලට ගැනීමෙන් තොරව පුනරුත්ථාපනය හා සංවර්ධනය වෙත ප්‍රවිෂ්ට වීම මගින් මධ්‍ය හා දිගු කාලීනව ගැටුම්/ආතතීන් පැන නැගීමටත් දරිද්‍රතාව වැඩි වර්ධනය වීමටත් බොහෝ ඉඩකඩ ඉතිරි කෙරෙයි. ඵලදායකත්වය හා තිරසර මූල පිරීම් සියලු වැඩසටහන් සැලසුම් කිරීම්වල, ඇගයීමේ හා වාර්තාකරණයේ කේන්ද්‍රය විය යුතු ය. ප්‍රමුඛතාවන්

ස්ථාපනය කළ යුතු ය, වගකීම් සම්බන්ධීකෘත ආකාරයකින් පැවරිය යුතු ය, එක් එක් අවයවවල ක්‍රියාත්මක වීම සුසංවාදී ක්‍රමයකින් පැහැදිලි කළ යුතු ය. සාමකාමී, සාධාරණ හා තිරසර මානව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට, සහ ශ්‍රී ලංකාවේ සියලු කොටස් තුළ පරිපාලන පිළිවෙත් ව්‍යාප්ත කිරීමට, සහ රටේ ආයතන, සංවිධාන හා මහජනයා දිගු කාලීනව බාහිර ආධාර මත රඳා පැවතීම මග හැරීමට එබඳු තත්ත්වයක් අවශ්‍ය ය.

| |
|---|
| **9** වන මූලධර්මය: අප සහාය දීමට බලාපොරොත්තු වන්නන්ට ද අප සම්පත් ලබා ගන්නා අයට ද වගකීමට අපි බැඳී සිටිමු. සහාය ලබා දීමට කැමති වන අය හා ව්‍යසන අතරතුර සහාය අවශ්‍ය කරන අය අතර හවුල්කාරකමෙහි ආයතනික පුරුකක් ලෙස අපි නිතර ම ක්‍රියා කරන්නෙමු. එහෙයින් දෙකොට්ඨාසයට ම වගකීමට අපි බැඳී සිටිමු. ආධාර දෙන්නන් හා ප්‍රතිලාභීන් සමග අපගේ සියලු ගනුදෙනු විවෘත භාවයේ හා විනිවිද භාවයේ ආකල්පයක් ප්‍රතිබිම්බනය කරනු ඇත. මූල්‍යමය ඉදිරි දැක්ම අතිනුත් ඵලදායකත්වයේ ඉදිරි දැක්ම අතිනුත් අපගේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා තැබීමේ අවශ්‍යතාව අපි හඳුනා ගනිමු. ආධාර බෙදා හැරීම් පිළිබඳ අදාළ නිරීක්ෂණ කටයුතු නිශ්චිත වශයෙන් සිදු කිරීමටත් ව්‍යසන සහාය ලබා දීමේ බලපෑම පිළිබඳව නිතිපතා තක්සේරු සිදු කිරීමටත් වන අනිවාර්යතාව අපි හඳුනා ගනිමු. එමෙන් ම අපගේ කටයුතුවල බලපෑම හා එම බලපෑම සීමා කරන හෝ ඉහළ නංවන සාධක පදනම් කර ගෙන ද වාර්තා තැබීමට අපි උත්සාහ ගන්නෙමු. වටිනා සම්පත් අපතේ යාම අවම කිරීම පිණිස වෘත්තීය භාවයේ හා විශේෂඥ භාවයේ උසස් ප්‍රමිතීන් මත අපගේ වැඩසටහන් පදනම් කෙරෙනු ඇත. |

නව වන මූලධර්මය තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වන්නේ වගකීම් සහගත භාවය හා විනිවිද භාවය යි:

- ආධාර දෙන්නන් හා ප්‍රතිලාභීන් සමග ගනුදෙනු කිරීමේ දී විවෘත භාවය
- මූල්‍යමය ලෙස හා ක්‍රියාකාරකම් මත විනිවිද පෙනෙන ආකාරයකින් වාර්තා තැබීමේ අවශ්‍යතාව
- ආධාර බෙදා හැරීම හා සහාය දීම නිරීක්ෂණය කිරීම
- බලපෑම් පිළිබඳ නිතිපතා තක්සේරු කිරීම්
- අල්ලස හා දූෂණය

9 වන මූලධර්මය ඉල්ලා සිටින්නේ තමන් සෘජුව සහාය ලබා දෙන ජනතාවටත් තමන් තමන්ගේ අරමුදල් ලබා ගන්නා නියෝජ්‍යායතනයන්ටත් වගකීමට රාජ්‍ය නොවන

සංවිධාන බැඳී සිටිය යුතු බව යි. රාජ්‍ය නොවන සංවිධාන තමන් උපකාර කිරීමට බලාපොරොත්තු වන ජනතාවගේ අවශ්‍යතාවන් නියෝජනය කිරීමට විශේෂයෙන් උරුමකම් කියයි. කෙසේ වුවත් වගකීම පිළිබඳ ප්‍රශ්න සාමාන්‍යයෙන් කේන්ද්‍රගත වන්නේ තමන්ගේ මූල්‍යමය සම්පත් කවර රාජ්‍ය නොවන සංවිධානවලින් ලබා ගන්නේ ද යන අරමුදල් අංශය වෙත ය. නව වන IFRC/ICRC මූලධර්මය අවධාරණය කරනුයේ, මානව සුහසාධන ආධාර අවශ්‍යව සිටින කාන්තාවන්, පිරිමින්, ළමුන් හා ප්‍රජාවන් මානව සුහසාධන සේවාවන්ගේ ප්‍රතිග්‍රාහකයන් ලෙස පමණක් වටහා නො ගත යුතු අතර රාජ්‍ය නොවන සංවිධාන විසින් සෘජුව ම වගකිව යුතු පාර්ශ්වයන් ලෙස වටහා ගත යුතු බව යි.

ශ්‍රී ලංකාවෙහි අභ්‍යන්තර ගැටුම හා සමාජ ආතතීන් (අප්‍රකට හා දෘශ්‍යමාන) රට තුළ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරකම් ගැන උත්සුකතාවන් නංවා ඇත. එබඳු උත්සුකතාවන් විසින් විශ්වාසය, සංස්කෘතිකමය යෝග්‍යත්වය, වාර්ගික-දේශපාලනික කරුණු, ඊනියා නව අධිරාජ්‍යවාදය පිළිබඳ මතවාදයන් ගැන වන ගැටලු විශේෂයෙන් උලුප්පා දක්වයි. සමහර අවස්ථාවල දී, සංවර්ධන හා පරිපාලන ක්‍රියා දාමයන්හි නීත්‍යානුකූල ක්‍රියාකාරකයන්ට වඩා ආණ්ඩුවට/පරිපාලන අධිකාරයන්ට තර්ජනයක් ලෙස රාජ්‍ය නොවන සංවිධාන අංශය දැක ගැනෙයි. එම නිසා රාජ්‍ය නොවන සංවිධානවල විශ්වාසවන්ත භාවය ශ්‍රී ලාංකාව තුළ අතිමහත් වැදගත්කමක් ගන්නා අතර, ආමන්ත්‍රණය නො කළ හොත් එමගින් දේශීය ප්‍රජාවන්ට, දේශීය රාජ්‍ය නොවන සංවිධාන අංශයට හා රටෙහි බිඳෙනසුලු සටන් විරාම ගිවිසුමට මධ්‍ය හා දිගු කාලීන අනර්ථයක් ඇති විය හැකි ය.

පීඩාවට පත් ජනතාව කෙරෙහි වගකීම් සහගත භාවයෙන් යුතුව ක්‍රියා කිරීම දේශීය රාජ්‍ය නොවන සංවිධානවල නීත්‍යානුකූල භාවය සම්බන්ධයෙන් බලගතු වේ. දේශීය මහජනතාවන්, ප්‍රජාවන්, දේශීය සංවිධාන හා දේශීය ව්‍යුහයන් බල ගන්වන සංයුක්ත විනිවිද පෙනෙන යාන්ත්‍රණ වනාහි දේශීය විශ්වාසවන්ත භාවය වැඩි දියුණු කරන මෙවලම් වේ.

මේ සම්බන්ධයෙන් ගත් කල රාජ්‍ය නොවන සංවිධානවලට හර ක්ෂේත්‍ර තුනක වගකීම් සහගත භාවය උදෙසා නිශ්චිත යාන්ත්‍රණයන් සූත්‍රගත කළ හැකි ය:

පළමු කොට, රාජ්‍ය නොවන සංවිධාන තම සංවිධානයේ අගයන් සැලකිල්ලට ගනිමින් විවෘත භාවය ප්‍රදර්ශනය කළ යුතු අතර සංවිධානය බැඳී සිටින්නා වූ කල්ක්‍රියා සංග්‍රහය(න්) ගැන නිශ්චිත විය යුතු ය. රාජ්‍ය නොවන සංවිධාන තමන් සහාය දැක්වීමට බලාපොරොත්තු වන පුද්ගලයන්ට, එමෙන් ම තම සංවිධානය මූල්‍ය සම්පත් ලබා ගන්නා නියෝජ්‍යායතනවලට තම සංවිධානවල දැක්ම/ඉලක්කය පැහැදිලි

කළ යුතු ය. විශේෂයෙන්, සපයන සහායෙන් ඍජුව ප්‍රතිලාභ ලබන කාන්තාවන්, පුරුෂයන්, ඔවුන්ගේ පවුල් හා ප්‍රජාවන් සම්බන්ධිතව රාජ්‍ය නොවන සංවිධානයට ඉටු කර ගත නො හෙන අපේක්ෂාවන් ජනනය වීම වළක්වා ලීමට අවධානය යොමු කළ යුතු ය.

දෙවනුව, රාජ්‍ය නොවන සංවිධාන තම දැක්මේ/ඉලක්කයේ ප්‍රායෝගික භාවිතය සහ තමන් සහාය දීමට අපේක්ෂා කරන ජනයාගේ ජීවනෝපායයන් කෙරෙහි එහි බලපෑම ප්‍රලේඛනය කළ යුතු ය. විශේෂයෙන් කාන්තාවන්ගේ මෙන් ම පුරුෂයන්ගේ ද සම්බන්ධ වීම සහ සහභාගිත්වය ඇතිව කෙරෙන ව්‍යසන තුරන් කිරීම, සාමකාමී ප්‍රතිචාර දැක්වීම හා ප්‍රකෘතිකරණය සඳහා වන ඵලදායී ප්‍රජා-පාදක ක්‍රමෝපායයන් පිළිබඳ යහපරිචයන් හා පාඩම්වලින් ඉගෙන ගත් දෑ ක්‍රමානුකූලව එක්තැන් කළ යුතු ය. ඍජුව සහාය ලබන කාන්තාවන් හා පුරුෂයන්/ප්‍රජාවන් මෙන් ම වෙරළබඩ ප්‍රදේශවල පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළ සහභාගි වීමට කළ කැඳවුමකින් පශ්චාත්-සුනාමි ප්‍රතිචාරයෙහි ලා පෙරට පැමිණි දේශීයයන් හා අමුත්තන් ද ඇතුළුව මුල පිරීම් විසින් ඍජුව සම්බන්ධ කර ගත් පුළුල් මහජනතාවගේ සහ/හෝ කොටස්කාර කණ්ඩායමේ(කණ්ඩායම්වල) නියෝජිතයන් සමගින්, ක්‍රියාකාරකම් හා ඒවායේ බලපෑම් පිළිබඳව ක්‍රියාකාරී සහභාගිත්වය මගින් ප්‍රතිපෝෂණයන් සැපයීම සඳහා නිතිපතා රැස්වීම් – නිදසුනක් ලෙස මාසිකව – පැවැත්විය හැකි ය. මේ ආකාරයේ රැස්වීම් පීඩාපත් කාන්තාවන්, පුරුෂයන් හා ප්‍රජාවන්ට නියෝජනාත්මක හා අර්ථවත් විය යුතු අතර ඔවුන්ගේ පෞද්ගලික හා කාලය පිළිබඳ සීමාමායිම්වලට ගරු කළ යුතු ය.

තව දුරටත්, රැස්වීම නියම කර ගත යුතු වේලාව කුමක් ද යන්න හා අදාළව කාන්තාවන්ට හා පුරුෂයන්ට විශේෂ වූ විවිධ සමාජමය කාල සටහන් ඇති බව ගැන රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් කළ යුතු ය. නිදසුනක් ලෙස, විවිධ ප්‍රජාවන්හි කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට/ළමුන්ට පුරුෂයන්ට වෙනස්ව ස්නානය සඳහා දිනය තුළ වෙන් කර ගත් වේලාවන් තිබිය හැකි ය. නිතර ම කාන්තාවන් විසින් ඉටු කෙරෙන ඉවුම්පිහුම් වැනි ගෘහමය ක්‍රියාකාරකම්වලට ද පිරිමින්ගේ සමාජමය ක්‍රියාකාරකම් හා සමපාත නොවන දිනය තුළ වෙන් කර ගත් විශේෂිත කාලවේලාවක් තිබේ. එම නිසා ඒකාබද්ධ හා අපක්ෂපාතී ආකාරයකින් දේශීය කොටස්කරුවන්ගේ සහභාගිත්වය සහතික කරනු වස්, සහභාගිත්වය, ප්‍රජාවේ තනි තනි කණ්ඩායම්වල හඬ නැංවීම හා ස්ත්‍රී-පුරුෂ විශේෂී සහ/හෝ වයස් කාණ්ඩ-විශේෂී උත්සුකතාවන් හඳුනා ගැනීම වැඩි දියුණු කළ හැකි, සාමූහික හෝ ස්ත්‍රී-විශේෂී, තරුණ හා ළමා-විශේෂී උපදෙස් ලබා ගැනීම වැනි විශේෂ කොට තෝරා ගත් කණ්ඩායම්වල උපදෙස් විමසීමේ රැස්වීම් පැවැත්වීම දැවැන්ත වැදගත්කමක් ගනී.

නිතිපතා පැවැත්වෙන ප්‍රතිපෝෂක හා උපදෙස් විමසීමේ රැස්වීම් මගින් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය හා ඇගයීමට පහසුකම්කරණය කිරීම පමණක් නො ව දේශීය ක්‍රියාකාරකයන් හා හවුල්කරුවන් බල ගැන්වීමට සේවය කිරීම ද කරනු ඇත. හවුල්කාරකම තක්සේරු කිරීමක් සිදු කිරීම මගින් රාජ්‍ය නොවන සංවිධාන කෙරෙහි විශ්වාසවන්ත භාවය ගෙන ඒමටත් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා දාමයෙහි යහපරිචයන් හඳුනා ගැනීම හා පාඩම් උගෙනීම වැඩි දියුණු කිරීමටත් හැකි වේ.

තුන් වනුව, රාජ්‍ය නොවන සංවිධාන අරමුදල් සපයන නියෝජ්‍යායතන විසින් නියම කරන ලද කොන්දේසි වෙනුවෙන් පෙනී සිටිය යුතු අතර මූල්‍ය සම්පත් සම්පාදකයා සමග ඇති කර ගත් ගිවිසුමට/අවබෝධාත්මක ලියවිල්ලට බැඳී ගත යුතු ය. තීරණ ගැනීම හා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම, නිරීක්ෂණය සහ ඇගයීම දැනුම් දීම සඳහා කාලානුරූපව හා නිතිපතා බලපෑම් තක්සේරු සිදු කළ යුතු ය. එසේ නො කළ හොත් ඇතැම් විට වටිනා සම්පත් ද තාක්ෂණික විශේෂඥතාවන් ද අපතේ යා හැකි ය. දූෂණය කිසි ලෙසකිනුත් ඉවසා නොදැරීමේ මූලධර්මයක් පිළිගැනීමෙන් හඳුනා ගැනෙන්නේ, සම්පූර්ණ විනිවිද භාවය හා වගකීම් සහගත භාවය යනු ක්‍රියාකාරිත්වයේ සියලු පැතිකඩ සඳහා අදාළ කර ගත යුතු හර වටිනාකම් බවත් රාජ්‍ය නොවන සංවිධානවල නීත්‍යානුකූල භාවය සඳහා කේන්ද්‍රීය වන බවත් ය.

ප්‍රතිඵලයෙහි දී, රාජ්‍ය නොවන සංවිධාන තමන්ගේ මානව සුභසාධන සහායෙන් හා තමන්ගේ ක්‍රියාකාරකම්වලින් මුදුන් පමුණුවා ගන්නා ලද සැබෑ තහවුරු කිරීම් කවරේ දැයි හඳුනා ගත යුතු ය. නිරීක්ෂණය හා ඇගයීම, විශ්ලේෂණය හා වාර්තා කිරීම සඳහා වූ යාන්ත්‍රණයන් තුළින් ධනාත්මක මෙන් ම ක්‍රියාකාරකම්වල කවර හෝ අනපේක්ෂිත ඍණාත්මක ප්‍රතිඵල ද පිළිබිඹු කළ යුතු ය. ස්ත්‍රී-පුරුෂ සබඳතාවන්හි ඇති වූ වෙනස්කම් ද මීට ඇතුළත් කළ යුතු ය. එම නිසා රාජ්‍ය නොවන සංවිධානවලට තමන් ආධාර කිරීමට උත්සාහ ගන්නා මහජනතාව කෙරෙහි, සත්කාරක ආණ්ඩුව/පරිපාලන ව්‍යුහයන් කෙරෙහි සහ තම ක්‍රියාකාරකම්වලට අරමුදල් සපයන ආධාර දෙන්නන් කෙරෙහි වන සිය වගකීම පවත්වා ගත හැකි ය. රාජ්‍ය නොවන සංවිධානවල අව්‍යාජ කැමැත්ත ද ආණ්ඩුව/පරිපාලන න්‍යාය පත්‍රයන් සහ ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන නිරීක්ෂණ යාන්ත්‍රණයන්/"මුර බල්ලන්" ලෙස සේවය කරන අතර ආණ්ඩුවේ/පරිපාලන ව්‍යුහයන්ගේ වගකීම් සහගත භාවය හා ආධාර බෙදා දීම නිරීක්ෂණය කරයි.

රාජ්‍ය නොවන සංවිධාන වටිනාකම් මත පාදක වූ මහජන ආධාර සංවිධානයන් ලෙස සැලකේ. එම නිසා සංවිධානමය විශ්වාසවන්ත භාවය රැක ගැනීම සඳහා, සෑම රාජ්‍ය නොවන සංවිධානයක ම අභ්‍යන්තර පරිපාලනය විසින් ක්‍රියාත්මක වීමේ සෑම

මට්ටමක දී ම විධිමත් වගකීම් සහගත භාවය පිළිබඳ පිළිවෙත් තහවුරු කළ යුතු අතර ආධාර බෙදා දීමේ දී හා සහාය ලබා දීමේ දී විනිවිද භාවය ප්‍රවර්ධනය කළ යුතු ය.

| |
|---|
| **10** වන මූලධර්මය: අපගේ තොරතුරු සැපයීමේ, ප්‍රචාරයේ හා ප්‍රචාරණයේ ක්‍රියාකාරකම් තුළ දී අපි ව්‍යසනයට ගොදුරු වූවන් බලාපොරොත්තු රහිත වස්තූන් ලෙස නො ව උදාර මිනිසුන් ලෙස හඳුනා ගත යුතු වෙමු. ක්‍රියාකාරිත්වයේ සමකොටස්කරුවෙකු ලෙස ව්‍යසනයට ගොදුරු වූ පුද්ගලයාට ගරු කිරීම නැති කර නො ගත යුතු ය. අපගේ පොදු තොරතුරු සැපයීම තුළ දී අපි ව්‍යසන තත්ත්වය පිළිබඳව ව්‍යසනයට ගොදුරු වූවන්ගේ පීඩාවට පත් විය හැකි තත්ත්වයන් හා භීතීන් පමණක් නො ව ඔවුන්ගේ හැකියාධාරිතාවන් හා අභිලාෂයන් උත්කර්ෂණය කරන විෂයබද්ධ ප්‍රතිරූපයක් චිත්‍රණය කළ යුත්තෙමු. පොදු මහජනයාගේ ප්‍රතිචාරය වැඩි වර්ධනය කරනු පිණිස අප මාධ්‍ය සමග සහයෝගී වන අතරවාරයේ දී ප්‍රචාරය සඳහා වූ බාහිර හෝ අභ්‍යන්තර වුවමනාවන්ට සමස්ත සහන සහාය උපරිම කිරීමේ මූලධර්මය මත ආධිපත්‍යය දැරීමට අපි ඉඩ නොදෙන්නෙමු. මාධ්‍ය ආවරණය ප්‍රතිලාභීන්ට සපයන සහායට හෝ අපගේ කාර්ය මණ්ඩලයේ හෝ ප්‍රතිලාභීන්ගේ ආරක්ෂාවට හානි කළ හැකි විට දී අපි මාධ්‍ය ආවරණය ලබා ගැනීම සඳහා අනෙකුත් ව්‍යසන ප්‍රතිචාර නියෝජ්‍යායතන සමග තරග කිරීම මග හරිමු. |

දහ වන මූලධර්මය තුළ පවත්නා මුඛ්‍ය කාරණාව වන්නේ ප්‍රචාරක කටයුතුවල දී හා තොරතුරු බෙදාහදා ගැනීමේ දී පීඩාපත් මහජනතාවගේ අභිමානය යි.

- මානව අභිමානය සහ පීඩාපත් මහජනතාවන් ක්‍රියාකාරිත්වයේ සමකොටස්කරුවන් බව හඳුනා ගැනීම
- ව්‍යසනයෙන් පීඩාවට පත් මහජනතාවන්ගේ හැකියාධාරිතාවන් හා ප්‍රාර්ථනාවන් උත්කර්ෂයට නැංවීම
- අනෙක් ව්‍යසන ප්‍රතිචාර නියෝජ්‍යායතන සමග තරගය මග හැරීම
- සහාය ලබා ගන්නන්ගේ හා මානව සුභසාධන කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව

දහ වන IFRC/ICRC මූලධර්මය ඉල්ලා සිටිනුයේ සමස්ත සහායනය උපරිම කිරීමේ මූලධර්මය තහවුරු කිරීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීම සහයෝගී ආකාරයකින් සිදු කිරීම යි. තොරතුරු එක්රැස් කිරීමේ හා කළමනාකරණයේ සියලු කටයුතුවල දී සමූහගත කිරීම, විශ්ලේෂණය, හා ස්ත්‍රී-පුරුෂ භාවය හා වයස අනුව විස්තාරණය වූ දත්ත සඳහා නියමයන් ඇතුළත් කළ යුතු ය. එසේ කිරීමේ දී, පීඩාපත්

කාන්තාවන්ගේ, පුරුෂයන්ගේ, තරුණියන්ගේ හා ගැහැණු හා පිරිමි ළමුන්ගේ, එමෙන් ම නියෝජිත ප්‍රජාවන්ගේ උත්සුකතාවන්, හැකියාධාරිතාවන් හා ප්‍රාර්ථනාවන් සියලු පුනරුත්ථාපන හා සංවර්ධන ප්‍රයත්නයන්හි හරය ලෙස පවත්වා ගත යුතු ය.

අභ්‍යන්තර ගැටුම විසි වසරක් තිස්සේ පැවතීමේ ප්‍රතිඵලය වී ඇත්තේ මාධ්‍යය බලගතු ලෙස වාරණය කිරීම හා දේශපාලනිකව පාලනය කිරීම යි, එනම් මූලිකව ම යුද්ධය සඳහා සහාය ජනනය කිරීමට මාධ්‍යය යොදා ගැනීම යි. ශ්‍රී ලංකාව තුළ තොරතුරුවල බලපෑම් හා තොරතුරු සපයන්නන් පිළිබඳව දැනුවත් වීමත් එම මූලාශ්‍ර අවදානමේ නොදැමෙන ආකාරයෙන් විධිමත් ලෙස පවත්වා ගෙන යාමත්, එමෙන් ම සෑම ප්‍රජාවක් තුළ ම සහ විවිධ ප්‍රජාවන් හා ප්‍රදේශ අතර දේශපාලනික කණ්ඩායම්වල විවිධත්වය පිළිබඳව විමසිල්ලෙන් සිටීමත් අත්‍යවශ්‍ය වන්නේ මේ නිසා ය.

එම තොරතුරු දැන ගන්නා අතරතුර තොරතුරු විසින් ආතතිය ඉහළ නංවා මහජනයා අවදානමට ඇද දැමිය හැකි නිසා, මාධ්‍යය ද ඇතුළු අනෙකුත් වෙත එම පාඩම් හා දැනුම ප්‍රයෝජනයට ගැනීමට සලසමින්, හදිසි උත්සුකතාවන්ට ප්‍රතිචාර දැක්වීමට, ඒවා ආමන්ත්‍රණය කිරීමට හා ඉස්මත්තට ගැනීමට, සහ වැදගත් දේශීය, දීප ව්‍යාප්ත හා ජාත්‍යන්තර ප්‍රශ්න පිළිබඳ තොරතුරු බෙදාහදා ගැනීමට ඇති තමන්ගේ වටිනා කැමැත්ත තහවුරු කරමින්, තම සොයා ගැනීම් මහජන බලමණ්ඩලවලට ඉදිරිපත් කිරීමට රාජ්‍ය නොවන සංවිධාන පරිශ්‍රම දැරිය යුතු ය.

ප්‍රමුඛ අවශ්‍යතාවන් හඳුනා ගැනීමෙහි ලා තොරතුරු එක්රැස් කිරීම, පතුරවා හැරීම හා බෙදාහදා ගැනීම කේන්ද්‍රීය වන අතර මානව සුභසාධන ප්‍රයත්නයන් ඵලදායීව සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වේ. සියලු කොටස්කරුවන් වෙත තොරතුරු පුළුල්ව පතුරවා හැරීම ක්‍රියාකාරකම්වල විනිවිද භාවයට ද ක්‍රියාකාරකම් දෙවරක් සිදු වීම මග හැරීමට ද මාවත සපයයි.

වර්තමානයේ සැලකිල්ලට ලක් වී ඇති කරුණක් නම්, බොහෝ සංවිධාන පුනරුත්ථාපන හා සංවර්ධන ක්‍රියා දාමයෙහි සැබෑ අවශ්‍යතාවන් පිළිබඳව අප්‍රමාණවත් තොරතුරු හා දැනුම සහිතව සහාය සැලසුම් කිරීම හා ක්‍රියාකාරකම් මෙහෙයවීම යි. ස්ත්‍රී-පුරුෂත්වයට විශේෂ වූ ගැටලු පිළිබඳව, හා ගර්භණී කාන්තාවන්, කිරි දෙන මව්වරුන්, කායිකව හා මානසිකව ආබාධිත පුද්ගලයන්, විශේෂ වෛද්‍යමය අවශ්‍යතා සහිත සහ නිතිපතා ඖෂධ ලබා දීම අවශ්‍ය කරන පුද්ගලයන් වැනි ප්‍රජාවන් තුළ පීඩාවට පත් විය හැකි තත්ත්වයේ සිටින මහජනතාව ගැන වන සවිස්තරාත්මක වාර්තා පිළිබඳව තොරතුරුවල ඇති හිදැස් තුරන් කිරීම සඳහා ක්ෂණික අවධානය හා හදිසි ක්‍රියා මාර්ගයක් අවශ්‍ය කෙරේ.

අනෙකුත් සමග වැඩ කටයුතු කිරීමේ දී හා තොරතුරු, අත්දැකීම් හා ජාත්‍යන්තර යහපරිචයන් එකිනෙක සම්බන්ධ කිරීමේ දී රාජ්‍ය නොවන සංවිධාන සියලු කොටස්කරුවන්ගේ පූර්ණ සම්බන්ධ වීම ද කාන්තාවන් හා කාන්තා කණ්ඩායම්/සංවිධාන අඩංගු කර ගැනීම ද සහතික කළ යුතු ය. එය කළ යුතු වන්නේ කාන්තාවන්ගේ හා පුරුෂයන්ගේ අවශ්‍යතාවන්, උත්සුකතාවන් හා තෝරා ගැනීම් විශ්ලේෂණය කිරීමට හා හඳුනා ගැනීමටත්, කාන්තාවන්, ගැහැණු ළමුන් වැනි වඩාත් ම පසෙකට තල්ලු වූවන්ගේ අවශ්‍යතාවන්ට ඇහුම්කන් දෙන බව, ඔවුන්ට සහාය සැපයීම සහ ඔවුන්ගේ අදහස් පිළිබිඹු කිරීම සහතික කිරීමටත් ය. එසේ කිරීමේ දී, පීඩාපත් ජනතාව බලාපොරොත්තු රහිත වස්තූන් ලෙස චිත්‍රණය කිරීම රාජ්‍ය නොවන සංවිධානවල ඉලක්කය නො විය යුතු අතර, ප්‍රචාරය හා ප්‍රචාරණය පිළිබඳ සියලු ක්‍රියාකාරකම්වල දී ඔවුන් අභිමානයෙන් යුත් කාන්තාවන්, පිරිමින්, ළමුන්, පවුල් හා ප්‍රජාවන් ලෙස හඳුනා ගන්නා බව සහතික කළ යුතු ය.

ව්‍යාකූලත්වය, සැකසංකා හා කඳවුරු තුළ වන කටකතා සහ කැපී පෙනෙන පුද්ගලයන් මත රඳා පැවැත්මක් ඇති වීම මග හැරීම සඳහා සියලු දේශීය හා ජාත්‍යන්තර ක්‍රියාකාරකයන්ට කාලානුරූපව හා පැහැදිලිව සැකසූ තොරතුරු ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වය ඇති කළ යුතු ය. ශ්‍රී ලංකාවෙහි අන්තර්-වාර්ගික ප්‍රචණ්ඩත්වය පුපුරා යාමට මුල පිරෙනු ඇත්තේ සුලු සිදුවීම් හෝ කටකතා, සහ විශේෂයෙන් ම අවශේෂ ප්‍රජාවන්හි සාමාජිකයන් සමග ප්‍රචණ්ඩ ගැටීම් සඳහා තරුණ ජනයා බලමුළු ගැන්වීමෙන් බව දැන ගනු ලැබ ඇත. පුද්ගලයන් ලියාපදිංචි කිරීම, එළඹෙන වෛද්‍යමය සායන, සලාක සැපයීම, නෛතික තතු, ඉඩම් පිළිබඳ අවශ්‍යතා, වන්දි පිළිබඳ අපේක්ෂා හා කඳවුරු සහ අවතැන් වූවන් සඳහා වන අනාගත පරිපාලන සැලසුම් සම්බන්ධයෙන් ගත් විට ක්‍රමානුකූල තොරතුරු බෙදාහදා ගැනීම හා ඒකාබද්ධ විශ්ලේෂණ සහ ඉගෙනුම විශේෂයෙන් වැදගත් වේ. ව්‍යසනයන් තුළ දී තොරතුරු ලබා ගැනීම සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය පිරිමින්ට වඩා අඩු වේ යැයි සිතිය හැකි නිසා තොරතුරු සඳහා කාන්තාවන්ගේ සමාන ප්‍රවේශය සහතික කිරීමත් ඇතැම් විට තෝරාබේරා ගත් හෝ විරූපිත ආකාරයකින් බෙදා හැරෙනු ඇති දෙවන ගණයේ කටින්කට යන තොරතුරු කාන්තාවන්ට ලැබීමේ සාමාන්‍ය සිද්ධිය වැනි දේ මග හැර යාම සඳහා ඔවුන්ට ඍජු තොරතුරු සම්පාදනය කිරීමත් සහතික කිරීම වැදගත් වේ.

තොරතුරු සපයන්නන් සමහර විට ආරක්ෂාව ඉල්ලා සිටින නිසාත් ඔවුන් සපයන තොරතුරු කෙරෙහි රහස්‍ය භාවයෙන් සැලකීම අවශ්‍ය විය හැකි නිසාත් තෝරා ගත් අවස්ථාවක දී විනිවිද භාවය අවශ්‍ය සුදුසුකමක් විය හැකි ය. මේ තත්ත්වය, ඇතැම් විට කඳවුරු තුළ තාඩනපීඩන, කායික සහ/හෝ ලිංගික අඩන්තේට්ටම් අත්දකිනු විය හැකි කාන්තාවන් වැනි තනි තනි වාර්ගික ප්‍රජාවන් හෝ ප්‍රජාවන් තුළ සිටින කණ්ඩායම් පිළිබඳව සංවේදී තොරතුරු එක්රැස් කිරීම සඳහා

විශේෂයෙන් අදාළ වේ. තොරතුරු එකතු කිරීමේ දී විශේෂයෙන් බහුසංස්කෘතික ප්‍රදේශවල ප්‍රජාවන් තුළ හා ප්‍රජාවන් අතර පැවතිය හැකි සැකසංකා හා තැවුල් සහගත භාවය කෙරෙහි සංවේදී විය යුතු ය.

තනි සංවිධානයක ස්වයං-ප්‍රසිද්ධිය සඳහා මූලිකව ම දායක වනු ඇති තොරතුරු ඇද ගැනීම වැනි උත්සුකයන් මත තමන් කටයුතු නොකරන බව රාජ්‍ය නොවන සංවිධාන විසින් තහවුරු කළ යුතු අතර, අවශේෂ පුනරුත්ථාපන හා සංවර්ධන ප්‍රයත්නයන් සමග කවර හෝ තරගයක යෙදීම වළක්වා ලීමට ඔවුන්ට අවවාද කළ යුතු ය. ශ්‍රී ලංකාවෙහි පුළුල් හා වෙනස් වූ මහජනතාවන්ගේ උත්සුකතාවන් හා අභිප්‍රායයන් සැලකිල්ලට ගැනීම ස්ථාවර හා තිරසර සාමය ප්‍රවර්ධනය උදෙසා වඩා යෝග්‍ය වේ. ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සඳහා වැඩ කරන දේශීය කාර්ය මණ්ඩලය ද – ශ්‍රී ලාංකික සිවිල් සමාජයේ කොටසක් වුවත් – බාහිර සංවිධානයක් නියෝජනය කරන අතර, ප්‍රජාවන් තුළ හා දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන අතර කවර හෝ අසමාන බල සබඳතාවන් හෝ සැක කිරීම් යළි වලංගු කිරීමක් ඇති නොවනු පිණිස ඔවුන්ගේ වෘත්තීමය හැකියාධාරිතාව තුළ වන මෙම නියෝජනාත්මක බලය පිළිබඳව කල්පනාකාරී විය යුතු ය.

තොරතුරු බෙදාහදා ගැනීමෙහි ලා ඒකාබද්ධ ක්‍රියාවලීන්ගේ අඩුකම මගින් නොමනාපය හා සැකය ඉපදිය හැකි ය. එම නිසා විශ්වාසය ගොඩ නැංවීම ප්‍රවර්ධනයත් අන්තර්-වාර්ගික ජීවනය වඩා ලීමත් තුළින් සහ රට තුළ තිරසර සංවර්ධනය පිළිබඳව සලකා බැලීමෙන්, පුනරුත්ථාපන හා සංවර්ධන ක්‍රියාවලිය තුළ දී පීඩාපත් ප්‍රජාවන්, මානව සුභසාධන සංවිධාන හා අනෙකුත් ක්‍රියාකාරකයන් ඒකාබද්ධ හා සාමූහික ආකාරයකින් සහභාගි වීම තහවුරු කිරීමට සියලු රාජ්‍ය නොවන සංවිධාන උත්සාහ කළ යුතු ය.

තොරතුරු එක්රැස් කිරීමේ දී දේශීය හා ජාත්‍යන්තර සංවාදය යොදා ගත යුතු වන අතර ම තොරතුරු එක්රැස් කිරීම එම සංවාදය ප්‍රවර්ධනය කළ යුතු ය. ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳව කටයුතු කිරීමෙහි ලා ප්‍රජාවේ සිට ආණ්ඩුව දක්වා වන දේශීය ජාලයන් උසස් තත්ත්වයට පත් කිරීමත් සංවර්ධනයත් කළ යුතු ය. ශ්‍රී ලංකාව තුළ ජනතා උත්සාහයෙන් ඇති වන සාමයක්, අපක්ෂපාතී හා තිරසර සංවර්ධන ක්‍රියාවලියක් උදෙසා වන දේශීය සිවිල් සමාජ ජාලයන්හි ගොඩ නැගී ඒමත් ඒවා ශක්තිමත් කිරීමත් සඳහා පහසුකම්කරණය කළ යුතු ය.

# ඇමුණුම්

* කෙටි යෙදුම්

* IFRC/ICRC විවරණ සංවර්ධනයෙහි ලා ආශ්‍රිත ලිපිලේඛන

* ත්‍රිකුණාමලයේ පැවති උපදෙස් විමසීමේ රැස්වීම්

* අතිරේක ලිපිලේඛන

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| ADB | - | ආසියානු සංවර්ධන බැංකුව |
| CESVI | - | සහයෝගිතාව සහ සංවර්ධනය: ඉතාලි නිදහස් සංගමය |
| CFA | - | සටන් විරාම ගිවිසුම |
| CHA | - | මානුෂීය සේවායතන සමූහය |
| CIDA | - | කැනඩානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනය |
| CPA | - | විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය |
| DFID | - | ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුව |
| DRC | - | ඩෙන්මාර්ක සරණාගත කවුන්සිලය |
| DWG | - | ආධාර දෙන්නන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම |
| CARITAS | - | යුක්තිය සාමය හා සංවර්ධනය පිළිබඳ කතෝලික නියෝජ්‍යායතනය |
| FCE | - | සාමූහික පැවැත්ම සඳහා වූ පදනම |
| FLICT | - | ගැටුම් පරිවර්තනය පිළිබඳ දේශීය මූල පිරිම් උදෙසා වූ අරමුදල |
| GA | - | ආණ්ඩුවේ ඒජන්ත |
| GTZ | - | Deutsche Gesellschaft fuer Teschnische zusammenarbeit |

| | | |
|---|---|---|
| HRC | - | මානව හිමිකම් කොමිසම |
| ICRC | - | ජාත්‍යන්තර රතු කුරුස කමිටුව |
| IDP | - | අභ්‍යන්තර අවතැන් වූවෝ |
| IFRC | - | රතු කුරුස රතු චන්ද්‍රවංක සමාජ ජාත්‍යන්තර සම්මේලනය |
| IMCAP | - | දරිද්‍රතා හා සාමාජීය ප්‍රතිපත්ති පර්යේෂණ පිළිබඳ හැකියාධාරිතා වර්ධනය |
| INGO | - | ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය |
| INTERSOS | - | ඉතාලි රාජ්‍ය නොවන සංවිධානය |
| JBIC | - | ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ජපාන බැංකුව |
| LTTE | - | දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය |
| MWRAF | - | මුස්ලිම් කාන්තා පර්යේෂණ හා ක්‍රියාකාරී සංසදය |
| NGHA | - | රාජ්‍ය නොවන මානව සුහසාධන නියෝජ්‍යායතනය |
| NGO | - | රාජ්‍ය නොවන සංවිධානය |
| NORAD | - | සංවර්ධන සහයෝගිතාව පිළිබඳ නෝර්වේ නියෝජ්‍යායතනය |
| SAPNA | - | දකුණු ආසියාතික දර්ශක ජාල සංගමය |
| SIDA | - | ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනය |
| SSA | - | සමාජ විද්‍යාඥයන්ගේ සංගමය |
| TRO | - | දෙමළ පුනරුත්ථාපන සංවිධානය |
| UMCOR | - | සහනාධාර පිළිබඳ එක්සත් මෙතෝදිස්ත කමිටුව |
| UN | - | එක්සත් ජාතීන්ගේ සංවිධානය |
| UNDP | - | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| UNHCR | - | සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය |
| UNICEF | - | එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල |
| USAID | - | ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍යායතනය |
| VSO | - | විදේශ ස්වේච්ඡා සේවය |
| WB | - | ලෝක බැංකුව |
| WFP | - | ලෝක ආහාර වැඩසටහන |
| WUSC | - | කැනඩා ලෝක විශ්වවිද්‍යාල සේවය |
| ZOA | - | මානව සුහසාධන සහාය උදෙසා වූ ක්‍රිස්තියානි සංවිධානය |

## IFRC/ICRC විවරණ සංවර්ධනයෙහි ලා ආශ්‍රිත ලිපිලේඛන

"පාරිසරික කළමනාකරණය හා ස්වාභාවික ව්‍යසන අවම කර ගැනීම පිළිබඳව එකඟ වූ නිගමන:" CSW: කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම (2002 මාර්තු)
http://www.siyanda.org/search/summary.cfm?nn=1550&ST=SS&Keywords=disaster%20reduction&SUBJECT=0&Donor=0&StartRow=1&Ref=Sim

" 'කල්ක්‍රියා සංග්‍රහය: ආපදා ප්‍රතිචාර වැඩසටහන්වල නියුතු ජාත්‍යන්තර රතු කුරුස සහ රතු චන්ද්‍රවංක ව්‍යාපාරය සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන කල්ක්‍රියා මූලධර්ම'වල විවරණ" (2005 පෙබරවාරි)

"බලය පැවරීමේ වගකීම් සහගත භාවය: රාජ්‍ය නොවන සංවිධාන මුහුණ දෙන උභතෝකෝටිකයෝ:" ANU: ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය (2004 ජනවාරි)
http://apseg.anu.edu.au/degrees/pogo/discussion_papers/P-DP04-1.pdf

"ශ්‍රී ලංකාව තුළ සුනාමියෙන් පීඩාවට පත් කාන්තාවන්ට සහාය දීම සඳහා වූ හවුල (CATAW) මගින් පිහිටුවූ 'කාන්තා අරමුදලක් සඳහා සහාය දීමට කරනු ලබන ආයාචනය';" CATAW (2005 ජනවාරි)
http://www/cleancatch.org/id83.html

"රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ අධ්‍යයනයක්: ශ්‍රී ලංකාව;" ADB: ආසියානු සංවර්ධන බැංකුව (1999)
http://www.adb.org/NGOs/docs/NGOSriLanka.pdf

"ස්වාධීනත්වය ද නැති නම් පරාධීනත්වය ද? උතුරු-දකුණු රාජ්‍ය නොවන සංවිධානවල හවුල්කාරිත්වය;" INTRAC: ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන පුහුණු සහ පර්යේෂණ මධ්‍යස්ථානය (2004 ජූලි)

"පශ්චාත්-ව්‍යසන තත්ත්වයන් තුළ දී මානව සුභසාධන සහාය සැපයීම පිළිබඳව ස්ථාපිත මාර්ගෝපදේශ පිළිපැදීම සඳහා වූ කැඳවුම: මඩකලපුව දිස්ත්‍රික්කය තුළ මෑත පශ්චාත්-සුනාමි සංවර්ධන ක්‍රියාකාරකම්වලට ප්‍රතිචාර දැක්වීමෙහි ලා සිවිල් සමාජ සාමාජිකයන්ගේ උත්සුකතාව පිළිබඳ ප්‍රකාශය;" (2005)

"හදිසි අවස්ථාවල දී මුහුණ දෙන අභියෝග;" FAO: එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය
http://www.fao.org/sd/dim_pe1/docs/pe1_050102d1_en.pdf

"පුනරුත්ථාපනය හා සංවර්ධනය පිළිබඳව සිවිල් සමාජයේ න්‍යාය පත්‍රය;" සිවිල් සමාජ වටමේසය (2005 ජනවාරි)
http://www.dailynews.lk/2005/01/22/fea03.html

"අවතැන් වූ කාන්තාවන්ගේ සුභසාධනය හා අයිතීන් පිළිබඳ උත්සුකතාව;" ව්‍යසන කළමනාකරණය සඳහා වූ කාන්තා හවුල – මඩකලපුව (2005 ජනවාරි)
http://www.cleancatch.org/id71.html

“සහන සහ සංවර්ධන වැඩසටහන් සඳහා ගැටුම් සංවේදී ප්‍රවේශ: ක්‍රියාත්මක වීමේ හවුල්කරුවන් සඳහා වූ GTZ මාර්ගෝපදේශ;” GTZ: Deutsche Gesellschaft fuer Teschnische zusammenarbeit (2005 පෙබරවාරි)

“රැකියා-මූලික ආයෝජන වැඩසටහන්;” ILO: එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය
http://www.ilo.org/public/english/employment/recon/eiip/invest.htm

“ක්‍රිස්තු ධර්ම ප්‍රචාරකවාදය: ශ්‍රී ලංකාවෙහි තත්ත්වයේ තරම;” ක්‍රමෝපායාත්මක අධ්‍යයනය සඳහා වූ කලාපීය මධ්‍යස්ථානය (1999)
http://www.rcss. org/policy_studies/ps_5_3.html

“ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා ව්‍යසන හේතු පොත;” ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා ව්‍යසනය පිළිබඳ ජාලය (2005)
http://online.northumbria.ac.uk/geography_research/gdn/

“ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා සුනාමිය;” ඔක්ස්ෆෑම් ජාත්‍යන්තරය (2005 මාර්තු)
www.oxfamamerica.org/.../briefing_papers/briefing_note.2005-03-30.6547801151/bn_tsunami_gender033005.pdf

“ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා සන්නද්ධ ගැටුම: අනාගතය පිළිබඳ නිරීක්ෂණ වාර්තාව;” BRIDGE: සංවර්ධනය – ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය, සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ ආයතනය, සසෙක්ස් විශ්වවිද්‍යාලය (2004)
http://www.bridge.ids.ac.uk/reports/cep-conflict-report.pdf

“ව්‍යසන තුළ ස්ත්‍රී-පුරුෂ සමානතාව: සහන හා යළි ගොඩ නැගීම් ඇති කිරීම සඳහා මූලධර්ම හයක්;” ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා ව්‍යසනය පිළිබඳ ජාලය (2005 ජනවාරි)
http://online.northnumbria.ac.uk/
geography_research/gdn/resources/genderbroadsheet.doc

“පාරිසරික අවදානම් කළමනාකරණයේ දී ස්ත්‍රී-පුරුෂ සමානතාව: සුනාමියෙන් ලද අත්දැකීම්;” IUCN: ලෝක සංරක්ෂණ සංගමය (2005 මාර්තු)
http://www.iucn.org/tsunami/news_archive/news/gender-tsunami-experience.pdf

“ප්‍රකෘතිකරණයේ හා යළි ගොඩ නැගීමේ ක්‍රමෝපාය පිළිබඳ මාර්ගෝපදේශන මූලධර්ම, ශ්‍රී ලංකාව;” ADB: ආසියානු සංවර්ධන බැංකුව, JBIC: ජාත්‍යන්තර සහයෝගිතාව පිළිබඳ ජපාන බැංකුව, සහ ලෝක බැංකුව (2005 ජනවාරි)
http://www.jbic.go.jp/japanese/base/topics/050131/pdf/srilanka.pdf

“ඉගෙන ගත් දුෂ්කර පාඩම්: සුනාමි ප්‍රතිචාර සඳහා වූ ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ සටහන්;” ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා ව්‍යසනය පිළිබඳ ජාලය (2005 ජනවාරි)
http://online.northumbria.ac.uk/geography_research/gdn/resources/hardlessons-gendermote1.doc

“ශ්‍රී ලංකාව තුළ මානව සුභසාධන කටයුතුවල තත්ත්වය: තත්ත්වය පිළිබඳ වාර්තාව;” OCHA: එක්සත් ජාතීන්ගේ මානව සුභසාධන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කාර්යාලය (2005 මාර්තු)
http:www.humanitarianinfo.org/srilanka/infocentre/sitreps/docs/SriLanka_OCHA_Humanitarian_Situation_Report%2018-22%20March%20%20PDF.pdf

“ඉන්දියානු සාගරය: භූ වලන – සුනාමිය 2005, මධ්‍ය කාලීන සමාලෝචනය;” OCHA: එක්සත් ජාතීන්ගේ මානව සුභසාධන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කාර්යාලය (2005 මාර්තු)
http://www.humanitarianinfo.org/srilanka/infocentre/donors/docs/Indian%20Ocean%20
MTR%20-%20Sri%20Lanka%20_Final_.pdf

“පශ්චාත්-ගැටුම් තත්ත්වයන්හි දී කාන්තාවන්ට එරෙහිව ලිංගිකත්වය පදනම් කර ගෙන එල්ල වන ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා වන දේශීය හා ජාත්‍යන්තර මැදිහත් වීම්;” එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වන ලෝක ආයතනය (2004 මැයි)
http://www.eldis.org/static/DOC17637.htm

“ජනවාර්ගික අර්බුදය සහ සුනාමි ව්‍යසනය නිසා පැන නගින ඉඩම් ප්‍රශ්න පිළිබඳ ලියවිල්ල;” CPA: විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය (2005)
http://www.cpalanka.org/research_papers/Memo_Land_issues.pdf

“ගැටුම් තුළ දී ආධාර සඳහා වන විකල්ප: ක්ෂේත්‍ර අත්දැකීම්වලින් ලද පාඩම්;” CDA: සංවර්ධන ක්‍රියාවන් පිළිබඳ සහයෝගිතා සමාගම (2000 දෙසැම්බර්)

"සාම සංවිධාන: ශ්‍රී ලංකාව;" SCOPP: සාම ක්‍රියාවලිය සම්බන්ධීකරණය සඳහා වූ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකාණ්ඩුව (2003 මැයි)
http://www.peaceinsrilanka.org/insidepages/Partners/partners.asp

"ශ්‍රී ලංකාවේ කාන්තා සංවිධානයන් විසින් නිකුත් කෙරුණු පුවත්පත් වාර්තා;" 'ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය ඇති කිරීම' (2005)
http://www.doinggender.com/index.php

"සුනාමියෙන් පසු යළි ඉදි කිරීම: එය හරියාකාරව කරන්නේ කෙසේ ද;" සීමාසහිත පාරිසරික පදනම (2005 ජනවාරි)
http://www.efl.lk/pdf/tsunami/Rebuildingtsunami.pdf

"සම්පත් කට්ටලය: සංවර්ධනය, මානව සුහසාධන සහාය හා සාමය ගොඩ නැගීම සඳහා ගැටුම් සංවේදී ප්‍රවේශ: සාමය සහ ගැටුම් බලපෑම් තක්සේරුව සඳහා මෙවලම්;" ජාත්‍යන්තර අවදි හා සුරක්ෂිත ලෝකය (International Alert & Safeworld) යන ආයතනවල වැඩසටහන (2003)
http://www.conflictsensitivity.org/resource_pack.html

"මානව සුහසාධන සහාය සම්බන්ධීකරණය පිළිබඳව යළි සිතා බැලීම;" පරිපාලනය හා වගකීම් සඳහා වූ ආයතනය, වර්ජිනියා ටෙක් (2004 ජූලි)
http://www.jhu.edu/~istr/conferences/toronto/workingpapers/stephenson.max.pdf

"ස්වාභාවික ව්‍යසනවල සමාජ-ආර්ථික බලපෑම්: ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ විශ්ලේෂණයක්;" ලතින් ඇමරිකාව හා කැරිබියානු දූපත් සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික කොමිසම, තිරසර සංවර්ධන සහ මානව පදිංචි කිරීම් ඒකකය සහ කාන්තා හා සංවර්ධන ඒකකය
http://www.eclac.cl/mujer/reuniones/conferencia_regional/manual.pdf

"සියැන්ඩා යාවත්කාලීනය: මානව සුහසාධන සහාය සහ යළි ගොඩ නැගීම;" BRIDGE: සංවර්ධනය – ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය, සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ ආයතනය, සසෙක්ස් විශ්වවිද්‍යාලය (2005 පෙබරවාරි)
http:www.siyanda.org/search/qlinx-countryfocus.cfm?code=SriLankafeb

"ශ්‍රී ලංකාව: සුනාමියෙන් දිවි ගලවා ගත්තවුන් දූෂණය කිරීම් පිළිබඳව ක්‍රියාකාරීහු අනතුරු අඟවති;" AWID: සංවර්ධනයෙහි ලා කාන්තා අයිතීන් පිළිබඳ සංගමය (2005 ජනවාරි)
http://www.awid.org/go.php?list=announcements&prefix=announcements&item=00217

"ශ්‍රී ලංකාවේ සුනාමි ප්‍රතිචාරය: දිස්ත්‍රික්ක තත්ත්ව පරීක්ෂණ ව්‍යායාමය. සාරාංශය;" HIC: මානව සුභසාධන තොරතුරු මධ්‍යස්ථානය. ශ්‍රී ලංකාව (2005 මාර්තු)
http://www.humanitarianinfo.org/srilanka/infocentre/reference/docs/District_Stocktaking_Exercise_Summary_Document_HIC.pdf>

"කල්ක්‍රියා සංග්‍රහය: ආපදා ප්‍රතිචාර වැඩසටහන්වල නියුතු ජාත්‍යන්තර රතු කුරුස හා රතු චන්ද්‍රවංක ව්‍යාපාරය සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ කල්ක්‍රියා මූලධර්ම;" රතු කුරුස සහ රතු චන්ද්‍රවංක සමාජ ජාත්‍යන්තර සම්මේලනය සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (1995 දෙසැම්බර්)
http://www.icrc.org/Web/Eng/siteeng0.nsf/html/57JMNB?OpenDocument

"මානව සුභසාධන ප්‍රඥප්තිය;" ස්ෆියර් ව්‍යාපෘතිය (සංශෝධිත මුද්‍රණය, 2004)
http:www.sphereproject.org/handbook/hdbkpdf/hdbk_hc.pdf

"ශ්‍රී ලංකාවේ යළි ගොඩ නැගීම හා සංවර්ධනය පිළිබඳ ටෝකියෝ ප්‍රකාශනය;" MOFA: විදේශ කටයුතු අමාත්‍යාංශය, ජපානය (2003 ජූනි)
http.//www.mofa.go.jp/region/asia-paci/srilanka/conf0306/declaration.html

"සුනාමි ආයාචනය: සුනාමි ව්‍යසනයෙන් දිවි ගලවා ගත් කාන්තාවන්ට කඩිනම් ආධාර අවශ්‍ය ය;" IPPF: ජාත්‍යන්තර සැලසුම්ගත දෙමාපිය සම්මේලනය (2005 ජනවාරි)
http://new.ippf.org/ContentController.aspx?ID=6144

"සුනාමි හදිසි අවස්ථා: පූර්ව ස්වාභාවික ව්‍යසනයන්හි පාඩම්;" ALNAP: මානව සුභසාධන ක්‍රියාවන්හි දී වගකීම් සහගත භාවය සහ ක්‍රියාකාරීත්වය සඳහා වූ ක්‍රියාකාරී ඉගෙනුම් ජාලය (2005)
http://www.alnap.org/pubs/pdfs/tsunamibriefing05.pdf

“සුනාමිය සහ ආබාධිත පුද්ගලයෝ: සැලකිල්ලට ගැනීම සඳහා වූ සාරාංශ කාරණා;” ACFID: ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ඕස්ට්‍රේලියානු කවුන්සිලය (2005 පෙබරවාරි)
http://www.wfot.org.au/officefiles/Disability-Tsunami%20Emergency%20Response%20Summary%20for%20ACFID%20Jan05.Pdf

“UN DPKO ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය ප්‍රධාන ප්‍රවාහගත කිරීම පිළිබඳ උපලේකම් ජනරාල්වරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය;” DPKO: සාමසාධක මෙහෙයුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුව (2005 මාර්තු)
http://pbpu.unlb.org/PBPU/Document.aspx?docid=630&classid=3&catid=22&subcatid=0

“ප්‍රමාණවත් ආහාර ලබා ගැනීමේ අයිතිය ප්‍රගතිශීලීව ක්‍රියාත්මක කිරීම සඳහා වන ස්වේච්ඡා මාර්ගෝපදේශ;” FAO: එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (2004 ඔක්තෝබර්)
“පීඩාවට පත් විය හැකි බව: තේරුම් ගැනීම පිළිබඳ කාරණාවක්;” බෙන්ෆීල්ඩ් ග්‍රෙග් හැසඩ් පර්යේෂණ මධ්‍යස්ථානය, ලන්ඩන් විශ්වවිද්‍යාල කොලීජිය (2001 නොවැම්බර්)
http://www.befieldhrc.org/SiteRoot/
disaster_studies/working_papers/workingpaper4.pdf

“සුනාමියෙන් පීඩාවට පත් රටවල කාන්තා මානව හිමිකම් පිළිබඳ උත්සුකතා;” APWLD: කාන්තාවන් පිළිබඳ ආසියා ශාන්තිකර සංසදය, නීතිය සහ සංවර්ධනය (2005 මාර්තු)
http://www.apwid.org/tsunami_humanrights.htm

“ශ්‍රී ලංකාව තුළ සාමය ගොඩ නැගීමේ කාන්තා ක්‍රියාකාරකම්;” UNIFEM: එක්සත් ජාතීන්ගේ කාන්තා සංවර්ධන අරමුදල
http://www.womenwarpeace.org/sri_lanka/sri_lanka.htm#women_building_peace

“කාන්තාවෝ: ස්වාභාවික ව්‍යසනයන්හි අවදානම් කළමනාකාරිනියෝ, දකුණු ආසියාව;”
SSRI: සමාජ විද්‍යා පර්යේෂණ ආයතනය, මැනෝවාහි හවායි විශ්වවිද්‍යාලය
http://www.ssri.hawaii.edu/research/GDWwebsite/pdf/Ariyabandu.pdf

# ත්‍රිකුණාමලයේ පැවති උපදෙස් විමසීමේ රුස්වීම්

**දේශීය රාජ්‍ය නොවන සංවිධාන**

1. CHA ත්‍රිකුණාමලය කාර්යාලය
2. නැගෙනහිර පුනරුත්ථාපන සංවිධානය
3. කින්නියා විෂන්
4. රාජ්‍ය නොවන සංවිධාන සමූහය
5. දෙමළ පුනරුත්ථාපන සංවිධානය
6. ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක සංවර්ධන සංගමය
7. ත්‍රිකුණාමල කාන්තා සුහසාධන සංවිධානය
8. එක්සත් කාන්තා සංවිධානය
9. සමාජ සේවා අධ්‍යාපන හා සංවර්ධන සංවිධානය

**දේශීය රජයේ මණ්ඩල**

10. ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක සහකාර ආණ්ඩුවේ ඒජන්ත
11. මුත්තූර් ප්‍රාදේශීය ලේකම්
12. එච්චාලම්පත්තු ග්‍රාම සේවා නිලධාරි
13. ත්‍රිකුණාමල මානව හිමිකම් කොමිසම
14. ත්‍රිකුණාමල සුනාමි කාර්ය සාධක බලකාය (UNV)

**දේශීය පෞද්ගලික අංශය**

15. ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක වාණිජ්‍ය මණ්ඩලය

**ආධාර දෙන ජාත්‍යන්තර ආයතන**

16. GTZ, ත්‍රිකුණාමලය
17. ඩොක්ටර්ස් ඔෆ් ද වර්ල්ඩ්
18. සාමයේ දූතයෝ (Mercy Corps)
19. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
20. සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය
21. ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍යායතනය
22. ඩෙන්මාර්ක සරණාගත කවුන්සිලය

**තනි පුද්ගලයෝ**

23. ත්‍රිකුණාමලය "සන්ඩේ ටයිම්ස්" වාර්තාකරු
24. ධීවර වෘත්තියෙහි නොයෙදෙන වෙරළබඩ ප්‍රජාවක මිනිසුන් දෙදෙනෙක්
25. තම ජීවනෝපායයන් අහිමි වී ඇති කුඩා පරිමාණ ව්‍යාපාරික කාන්තාවන් හා පිරිමි කීප දෙනෙක්

**රැස්වීම් හා වැඩමුළු**

26. "පශ්චාත්-සුනාමි උතුරු-නැගෙනහිර අනර්ථයක් නොකිරීම පිළිබඳ මූලධර්ම හා ගැටුම් සංවේදිතාව" පිළිබඳ වැඩමුළුව (GTZ ආයතනය විසින් සංවිධානය කරන ලදි)

27. සම්බන්ධීකරණ රැස්වීම: බර්ගොෆ් පදනම, CESVI, CHA කොළඹ, CHA ත්‍රිකුණාමලය, ක්‍රිස්තියානි ආධාර ආයතනය, DRC, EHED/CARITAS, Hellenic Aid, ICRC, INTERSOS, GTZ, GTZ-PIP, සාම දූතයෝ, OXFAM, ළමා රැකවරණය (Save the Children), UMCOR, UNHCR, USAID, WFP, WUSC,
ZOA සරණාගත රැකවරණය

# අතිරේක ලිපිලේඛන

<u>මාර්ගෝපදේශ</u>

"ව්‍යසන තුළ ස්ත්‍රී-පුරුෂ සමානතාව: සහන හා යළි ගොඩ නැගීම් ඇති කිරීම සඳහා මූලධර්ම හයක්;" ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා ව්‍යසනය පිළිබඳ ජාලය (2005 ජනවාරි)

"සුනාමිය සහ ආබාධිත පුද්ගලයෝ: සැලකිල්ලට ගැනීම සඳහා වූ සාරාංශ කාරණා;" ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ඕස්ට්‍රේලියානු කවුන්සිලය (ACFID), (2005 පෙබරවාරි)

"ආපදා ප්‍රතිචාර වැඩසටහන් සඳහා වන IFRC/ICRC කල්ක්‍රියා සංග්‍රහයේ විවරණ;" උපදෙස් විමසීමේ ක්‍රියාවලිය පහසුකම්කරණය කෙරුණේ බර්ගොෆ් පදනමෙනි; (2005 පෙබරවාරි)

"ප්‍රමාණවත් ආහාර ලබා ගැනීමේ අයිතිය ප්‍රගතිශීලීව ක්‍රියාත්මක කිරීම සඳහා වන ස්වේච්ඡා මාර්ගෝපදේශ;" එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (2004 ඔක්තෝබර්)

"සහන සහ සංවර්ධන වැඩසටහන් සඳහා ගැටුම් සංවේදී ප්‍රවේශ: ක්‍රියාත්මක වීමේ හවුල්කරුවන් සඳහා වූ GTZ මාර්ගෝපදේශ;" GTZ: Deutsche Gesellschaft fuer Teschnische zusammenarbeit (2005 පෙබරවාරි)

"ශ්‍රී ලංකාව: ප්‍රකෘතිකරණයේ හා යළි ගොඩ නැගීමේ ක්‍රමෝපාය පිළිබඳ මාර්ගෝපදේශන මූලධර්ම;" පහසුකම්කරණය කෙරුණේ ADB, JBIC හා ලෝක බැංකුව විසිනි (2005 ජනවාරි)

"ඉගෙන ගත් දුෂ්කර පාඩම්: සුනාමි ප්‍රතිචාර දක්වන්නන් සඳහා වූ ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ සටහන් - අංක 1: ප්‍රතිචාරය;" ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා ව්‍යසනය පිළිබඳ ජාලයේ සාමාජිකයෝ (2005 ජනවාරි)

“ආපදා ප්‍රතිචාර වැඩසටහන්වල නියුතු ජාත්‍යන්තර රතු කුරුස සහ රතු චන්ද්‍රවංක ව්‍යාපාරය සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන කල්ක්‍රියා මූලධර්ම” (1995 දෙසැම්බර්)

“මානව සුභසාධන ප්‍රඥප්තිය;” ස්ෆියර් ව්‍යාපෘතිය (සංශෝධිත මුද්‍රණය, 2004)

<u>සංක්ෂිප්ත ප්‍රායෝගික තොරතුරු</u>

“ස්වාධීනත්වය ද නැති නම් පරාධීනත්වය ද? උතුරු-දකුණු රාජ්‍ය නොවන සංවිධානවල හවුල්කාරිත්වය;” INTRAC: ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන පුහුණු සහ පර්යේෂණ මධ්‍යස්ථානය (2004 ජූලි)

“පාරිසරික අවදානම් කළමනාකරණයේ දී ස්ත්‍රී-පුරුෂ සමානතාව: සුනාමියෙන් ලද අත්දැකීම්;” IUCN: ලෝක සංරක්ෂණ සංගමය (2005 මාර්තු)

“සාම සංවිධාන: ශ්‍රී ලංකාව;” SCOPP: සාම ක්‍රියාවලිය සම්බන්ධීකරණය සඳහා වූ ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකාණ්ඩුව (2003 මැයි)

“සියැන්ඩා යාවත්කාලීනය: මානව සුභසාධන සහාය සහ යළි ගොඩ නැඟීම;” BRIDGE: සංවර්ධනය – ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය, සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ ආයතනය, සසෙක්ස් විශ්වවිද්‍යාලය (2005 පෙබරවාරි)

“ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා සුනාමිය;” ඔක්ස්ෆැම් ජාත්‍යන්තරය (2005 මාර්තු)

“ශ්‍රී ලංකාව තුළ සාමය ගොඩ නැඟීමේ කාන්තා ක්‍රියාකාරකම්;” UNIFEM: එක්සත් ජාතීන්ගේ කාන්තා සංවර්ධන අරමුදල

**උපගොනුව: මානුෂීය සේවායතන සමූහය (CHA)**
(සාමය හා සුනාමිය පිළිබඳ තෝරා ගත් CHA ලියවිලි)

CHA සහන මෙහෙයුම් රැස්වීම (2005 මාර්තු) - පවර් පොයින්ට් ඉදිරිපත් කිරීමකි

මාර්ගෝපදේශන මූලධර්ම පිළිබඳ CHA ප්‍රලේඛනය (2005 ජනවාරි-අප්‍රේල්)

"සාම මුල පිරිමි කෙරෙහි පශ්චාත්-සුනාමි ක්‍රියාකාරකම්වල ඇඟවුම්" පිළිබඳ CHA ප්‍රලේඛනය

<u>සවිස්තරාත්මක ලේඛන</u>

**ව්‍යසන කළමනාකරණය**

"හදිසි අවස්ථාවල දී මුහුණ දෙන අභියෝග;" FAO: එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය

"සුනාමියෙන් පසු යළි ඉදි කිරීම: එය හරියාකාරව කරන්නේ කෙසේ ද;" සීමාසහිත පාරිසරික පදනම (2005 ජනවාරි)

"සුනාමි හදිසි අවස්ථා: පූර්ව ස්වාභාවික ව්‍යසනයන්හි පාඩම්;" ALNAP: මානව සුභසාධන ක්‍රියාවන්හි දී වගකීම් සහගත භාවය සහ ක්‍රියාකාරිත්වය සඳහා වූ ක්‍රියාකාරී ඉගෙනුම් ජාලය (2005)

"ඉන්දියානු සාගරය: භූ චලන – සුනාමිය 2005, මධ්‍ය කාලීන සමාලෝචනය;"
OCHA: එක්සත් ජාතීන්ගේ මානව සුභසාධන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කාර්යාලය (2005 මාර්තු)

"ශ්‍රී ලංකාවේ සුනාමි ප්‍රතිචාරය: දිස්ත්‍රික්ක තත්ත්ව පරීක්ෂණ ව්‍යායාමය, සාරාංශය;"
HIC: මානව සුභසාධන තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාව (2005 මාර්තු)

**ගැටුම් සංවේදිතාව**

"ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හා සන්නද්ධ ගැටුම: අනාගතය පිළිබඳ නිරීක්ෂණ වාර්තාව;" BRIDGE: සංවර්ධනය – ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය, සංවර්ධන අධ්‍යයනයන් පිළිබඳ ආයතනය, සසෙක්ස් විශ්වවිද්‍යාලය (2004)

"ගැටුම් තුළ දී ආධාර සඳහා වන විකල්ප: ක්ෂේත්‍ර අත්දැකීම්වලින් ලද පාඩම්;" CDA: සංවර්ධන ක්‍රියාවන් පිළිබඳ සහයෝගිතා සමාගම (2000 දෙසැම්බර්)

"පශ්චාත්-ගැටුම් තත්ත්වයන්හි දී කාන්තාවන්ට එරෙහිව ලිංගිකත්වය පදනම් කර ගෙන එල්ල වන ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා වන දේශීය හා ජාත්‍යන්තර මැදිහත් වීම්;" එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වන ලෝක ආයතනය (2004 මැයි)

**සංවර්ධනය**

"රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ අධ්‍යයනයක්: ශ්‍රී ලංකාව;" ADB: ආසියානු සංවර්ධන බැංකුව (1999)

"ස්වාභාවික ව්‍යසනවල සමාජ-ආර්ථික බලපෑම්: ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පිළිබඳ විශ්ලේෂණයක්;" ලතින් ඇමරිකාව හා කැරිබියානු දූපත් සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික කොමිසම, තිරසර සංවර්ධන සහ මානව පදිංචි කිරීම් ඒකකය සහ කාන්තා හා සංවර්ධන ඒකකය

"පීඩාවට පත් විය හැකි බව: තේරුම් ගැනීම පිළිබඳ කාරණාවක්;" බෙන්ෆීල්ඩ් ග්‍රෙග් හැසඩ් පර්යේෂණ මධ්‍යස්ථානය, ලන්ඩන් විශ්වවිද්‍යාල කොලීජිය (2001 නොවැම්බර්)

"මානව සුහසාධන සහාය සම්බන්ධීකරණය පිළිබඳව යළි සිතා බැලීම;" පරිපාලනය හා වගකීම් සඳහා වූ ආයතනය, වර්ජිනියා ටෙක් (2004 ජූලි)

<u>සිවිල් සමාජය හා බහුපාර්ශ්වීය සංවිධානයන් විසින් නිකුත් කෙරුණු ප්‍රකාශ</u>

"පුනරුත්ථාපනය හා සංවර්ධනය පිළිබඳව සිවිල් සමාජයේ න්‍යාය පත්‍රය;" සිවිල් සමාජ වටමේසය (2005 ජනවාරි)

"ශ්‍රී ලංකාව තුළ සුනාමියෙන් පීඩාවට පත් කාන්තාවන්ට සහාය දීම සඳහා වූ හවුල (CATAW) මගින් පිහිටුවූ 'කාන්තා අරමුදලක් සඳහා සහාය දීමට කරනු ලබන ආයාචනය';" CATAW (2005 ජනවාරි)

"ජනවාර්ගික අර්බුදය සහ සුනාමි ව්‍යසනය නිසා පැන නගින ඉඩම් ප්‍රශ්න පිළිබඳ ලියවිල්ල;" CPA: විකල්ප ප්‍රතිපත්ති මධ්‍යස්ථානය (2005)

"ශ්‍රී ලංකාව: සුනාමියෙන් දිවි ගලවා ගත්තවුන් දූෂණය කිරීම් පිළිබඳව ක්‍රියාකාරිනු අනතුරු අඟවති;" AWID: සංවර්ධනයෙහි ලා කාන්තා අයිතීන් පිළිබඳ සංගමය (2005 ජනවාරි)

"ශ්‍රී ලංකාවේ කාන්තා සංවිධානයන් විසින් නිකුත් කෙරුණු පුවත්පත් වාර්තා;" 'ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය ඇති කිරීම' (2005)

“පශ්චාත්-ව්‍යසන තත්ත්වයන් තුළ දී මානව සුහසාධන සහාය සැපයීම පිළිබඳව ස්ථාපිත මාර්ගෝපදේශ පිළිපැදීම සඳහා වූ කැඳවුම: මඩකලපුව දිස්ත්‍රික්කය තුළ මෑත පශ්චාත්-සුනාමි සංවර්ධන ක්‍රියාකාරකම්වලට ප්‍රතිචාර දැක්වීමෙහි ලා සිවිල් සමාජ සාමාජිකයන්ගේ උත්සුකතාව පිළිබඳ ප්‍රකාශය;” (2005)

ශ්‍රී ලංකාවේ යළි ගොඩ නැගීම සහ සංවර්ධනය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය (2003 ජූනි)

“UN DPKO ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය ප්‍රධාන ප්‍රවාහගත කිරීම පිළිබඳ උපලේකම් ජනරාල්වරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය;” DPKO: සාමසාධක මෙහෙයුම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ දෙපාර්තමේන්තුව (2005 මාර්තු)

“අවතැන් වූ කාන්තාවන්ගේ සුහසාධනය හා අයිතීන් පිළිබඳ උත්සුකතාව;” ව්‍යසන කළමනාකරණය සඳහා වූ කාන්තා හවුල – මඩකලපුව (2005 ජනවාරි)

---

මෙම විවරනය සඳහා ඔබගේ අදහස් හා යෝජනා පහත දක්වා ඇති ලිපිනයන්ට එවිය යුතුය.

තොරතුරු නිලධාරිණී,
නො. 86, රොස්මිඩ් පෙදෙස,

කොළඹ 07.

හෝ

info@cha.lk

---